ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2026.10.19

පැමිණිලි පාර්ශවය : මහින්ද දේශප්‍රිය මයා,
සභාපති, සහකම්පන සංසදය,
අංක 110, පෝරඹ,
අම්බලන්ගොඩ.

ආචාර්ය අජන්තා පෙරේරා (පරිසර විද්‍යාඥ),
අංක 16, පන්සල පාර,
රත්තනපිටිය,
බොරලැස්ගමුව.

සී.අමරසිංහ මයා,
අංක 8/109, කහටගහවත්ත,
දම්පේ පාර, මාදම්පේ

එස්.එරන්ද ගුණදාස මයා
/29ඒ/1, නුවර පාර,
බෝතලාපිටිය,
ගම්පොල

වගඋත්තර පාර්ශවය :

01. අධ්‍යක්ෂක ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
අංක 383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07

02. අධ්‍යක්ෂක ජනරාල්,
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය,
2/120, විද්‍යා මාවත,
කොළඹ 07

03. සභාපති,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500, ටී.බී.ජයා මාවත,
කොළඹ 10

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. டி. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.
දුරකථනය / தொலைபேசி / Telephone: 94-11-250 5580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairman: 011 - 250 5451
ලේකම් / செயலாளர் / Secretary: 011 - 250 5521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 250 5541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / E-mail: secretary@hrcsl.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

04. අධ්‍යක්ෂක ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
අංක 230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

05. අධ්‍යක්ෂක ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
අංක 163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ.

<u>පැමිණිලි අංකය : HRC/HO/82/26, HRC/HO/4814/25, HRC/HO/4494/25,HRC/4896/25</u>

<u>පලමු පැමිණිලිකරු : මහින්ද දේශප්‍රිය මයා විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ ඇති කරුණු.</u>

<u>(HRC/HO/4814/25)</u>

- 2025.11.26 සිට 30 දක්වා වූ කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට බලපෑ ස්වභාවික ආපදා තත්ත්වයන්හිදී හානි අවම කර ගැනීමට අවශ්‍ය පූර්වෝපාය ගැනීම සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතන නිසි අවධානය හා සැලකිල්ල යොමු කර තිබේද යන්න සම්බන්ධයෙන් පුළුල් විමර්ශනයක් හා විධිමත් පරීක්ෂණයක් පවත්වා සුදුසු නිර්දේශ ලබා දෙන මෙන් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටියි.

<u>දෙවන පැමිණිලිකරු: ඒ.පෙරේරා මිය විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ ඇති කරුණු.</u>
<u>(HRC/HO/4494/25)</u>

- Tamil Guardian පුවත්පත උපුටා දක්වමින් පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටින්නේ, Indian Meteorology Department (IMD) විසින් නොවැම්බර් 20, 23 නිකුත් කරන ලද අනතුරු ඇඟවීම් ඇසුරෙන් සුළි කුනාටුව නිසි ලෙස 01 හා 02 විත්තිකරුවන්ට හඳුනා ගැනීමට නොහැකි වීම හේතුවෙන් 600කට අධික පිරිසක් මිය යෑම සම්බන්ධයෙන් තම පැමිණිල්ල ඉදිරිපත් කර සිටි. තවදුරටත් 20206.05.14 ලිඛිත නිරීක්ෂණයන්හි දන්වා සිටින්නේ, පෙත්සම්කාරිය පරිසරවේදිනියක් ලෙස බරපතළ පරිපාලන දුර්වලතාවයක් (**grave administrative failure**) සමස්ත ආපදා ක්‍රියාවලිය තුළ නිරීක්ෂණ කරන බවත්, මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් පුළුල් විමර්ශනයක් පැවැත්විය යුතු බවත්ය.

තෙවන පැමිණිලිකරු: සී.අමරසිංහ මයා විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ ඇති කරුණු.
(HRC/HO/82/26)

- ❖ සුළිකුණාටු වර්ධනය වූයේ එකවරම නොවන බව පවසන පෙත්සම්කරු ඉන්දියානු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිරීක්ෂණය කරන ලද, ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් වූ අඩු පීඩන තත්ත්වය 2025.11.27 ශ්‍රී ලංකා වේලාවෙන් අලුයම 1.30 ට අඩු පීඩන තත්ත්වය උත්සන්න වීම සිදුවූයේ 2025.11.27 උදෑසන 5.30 සිට 11.30 ලෙස දක්වයි.
- ❖ මේ අනුව අදාළ තත්ත්වය පෙර සිට හඳුනාගෙන ජනතාව දැනුවත් කිරීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට, ජංගම දුරකථන කෙටි පණිවිඩ හා හදිසි නිවේදන (**Mobile Emergency Alert**) හරහා එවැනි දැනුවත් කිරීම් නොකිරීම.

- ❖ කොත්මලේ වැනි ජලාශවල වාන් දොරටු විවෘත කිරීමට පෙර ගම්පොළ ආදී පහත් ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීමට හා සූදානම් කිරීමට කාලය තිබූ නමුත්, ජලාශයේ ජල මට්ටම වැඩිවන වේගය මත පදනම්ව කොත්මලේ වැනි ජලාශවල වාන් දොරටු විවෘත කිරීමට පෙර ගම්පොළ ආදි පහත ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීමට සූදානම් කිරීමට අනතුරු ඇඟවීමේ පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබීම.

- ❖ ජලාශවල ජල මට්ටම වැඩිවන වේගය මත පදනම්ව ජලාශවල ජලය නිකුත් කිරීමේදී ක්‍රමානුකූලව නිකුත් කිරීමට අවස්ථාව තිබියදීත් එසේ නොකිරීම.

- ❖ විදුලිය බිඳ වැටී තිබීම නිසා හදිසි තත්ත්වයක් සන්නිවේදනය කර ගැනීමට බාධාවක්ව තිබීම.

ව්‍යසනකාරී තත්ත්වය හේතුවෙන් විදුලිය ඇනහිටීම නිසා බොහෝ ප්‍රදේශ වල දුරකථන සන්නිවේදන බිඳ වැටීම. ආපදා සහන කණ්ඩායම්වලටට පවා සන්නිවේදනය බිඳවැටීම ගැටලුවක් වීම.

බෝතල් වලට ඉන්ධන නිකුත් නොකිරීම හේතුවෙන් විදුලි ජනන යන්ත්‍ර සඳහා ඉන්ධන ලබා ගැනීම ගැටළු සහගත වීම

ඇතැම් ඉන්ධන පිරවුම්හල්වල විදුලි ජනන යන්ත්‍රය නොතිබීම හේතුවෙන් ඉන්ධන ලබා ගැනීමට නොහැකි වීම නිසා ආපදාව තුළ ජනතාවට ආරක්ෂිත ස්ථාන වෙත ගමන් කිරීමට බාධාවක් වූවා මෙන්ම සහන සේවා කණ්ඩායම දැඩි අපහසුතාවයට පත්වීම .

මීට අමතරව පශ්චාත් ආපදා තත්ත්වයෙන් පසු වාර්තා නොවූ අතුරුදහන් වූවන් හා ජීවිතක්ෂයට පත් වූවන් සම්බන්ධව නිසි පරිදි සොයා බැලීමක් නොකිරීම.

අපදාවට පත් වූ මෝටර් රථ නිවාස හා ව්‍යාපාර වල රක්ෂණ සීමා නිසා ජනතාව මුහුණ දුන් ගැටලු

මීට අතිරේකව කොමිෂන් සභාවේ මැදිහත්වීම මත තාක්ෂණිකව යාවත්කාලීනවූ ආපදා කළමනාකරණ යාන්ත්‍රණයක් සැකසීමට අවශ්‍ය විවිධ පියවර නිර්දේශ කරන ලෙස ඉල්ලා සිටියි

<u>සිව්වන පැමිණිලිකරු: එස්.එරන්ද ගුණදාස මයා විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ ඇති කරුණු, (HRC/HO/4896/25)</u>

කොත්මලේ ජලාශයේ වාන් දොරටු මෙහෙයවීමේ නොසැලකිල්ල හේතුවෙන් පහළ ප්‍රදේශ ගංවතුරට ලක් වූ බවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

<u>පසුබිම:</u>

මහවැලි අධ්‍යක්ෂ ජනරාල් සහ කොත්මලේ ජලාශ භාර ඉංජිනේරුවරයාගේ ක්‍රියාකලාපය හේතුවෙන් ගම්පොල සහ මහවැලි ගඟ දෙපස ප්‍රදේශවලට හිතාමතා ගංවතුර තත්ත්වයක් ඇති කළ බවට චෝදනා කරයි.

<u>ප්‍රධාන චෝදනා:</u>

1) කොත්මලේ ජලාශයේ ප්‍රධාන අරමුණ ජල විදුලි නිෂ්පාදනය වන අතර, ගංවතුර පාලනයද එහි අරමුණක් බව සඳහන් කරයි.

2) ජලාශයේ ජල මට්ටම පාලනය කිරීම සහ ජලාශයේ ආරක්ෂාව සහතික කිරීම ජලාශ භාර නිලධාරීන්ගේ වගකීම බව සඳහන් කරයි.

3) ජලය මුදාහැරීමෙන් පහළ ප්‍රදේශවල ජනතාවගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමේ වගකීම නිසි ලෙස ඉටු නොකළ බවට චෝදනා කරයි.

4) 2025 නොවැම්බර් 27 දින වාන් දොරටු හදිසියේ විවෘත කිරීමෙන් විශාල ජල ප්‍රමාණයක් මහවැලි ගඟට එකතු වී ගම්පොල ප්‍රදේශයට දැඩි ගංවතුර තත්ත්වයක් ඇති වූ බව ප්‍රකාශ කරයි. එම ගංවතුර හේතුවෙන් විශාල ජීවිත හා දේපළ හානි සිදු වූ බව සඳහන් කරයි. මෙම සිද්ධිය ස්වාභාවික ආපදාවක් නොව, නිලධාරීන්ගේ ක්‍රියාකලාපයේ ප්‍රතිඵලයක් බවට පැමිණිලිකරු චෝදනා කරයි.

5) ජලාශයෙන් විශාල ජල ප්‍රමාණයක් එකවර මුදාහැරීමෙන් පහළ ප්‍රදේශවල ක්ෂණික ගංවතුර තත්ත්වයක් සහ ජීවිත හා දේපළ හානි සිදුවිය හැකි බව දැන සිටියද එසේ ක්‍රියා කළ බවට චෝදනා කරයි.

6) 2025 නොවැම්බර් 27 දින ජලය පූර්ව දැනුම්දීමකින් තොරව මුදාහැර ඇති බවට චෝදනා කරයි.ජලයෙන් යටවිය හැකි ප්‍රදේශ හඳුනාගෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී වසම් දැනුවත් කිරීමේ වගකීම ඉටු නොකළ බව සඳහන් කරයි.

7) අවදානම් ප්‍රදේශවල ජනතාව ඉවත් නොකර ජලය මුදාහැරීම හේතුවෙන් සිදුවූ ජීවිත හා දේපළ හානි සඳහා මහවැලි අධ්‍යක්ෂ ජනරාල්, ජලාශ භාර ඉංජිනේරුවරයා සහ කාර්ය මණ්ඩලය වගකිව යුතු බවට චෝදනා කරයි.

8) ජලය මුදාහැරීමට පෙර සයිරන් අනතුරු ඇඟවීමක් නිකුත් නොකිරීම නිසා ප්‍රදේශවාසීන්ට වාන් දොරටු විවෘත වූ බව දැනගැනීමට නොහැකි වූ බව සඳහන් කරයි.

9) විශාල ජල ප්‍රමාණයක් මුදාහැර පසුව වාන් දොරටු වසා දැමූ බවට චෝදනා කරයි.පසුදින සයිරන් නාද කළද පෙරදින එය සිදු නොකිරීම වගකීම පැහැර හැරීමක් බව සඳහන් කරයි. එම සිද්ධියෙන් ජනතාව අතර දැඩි කලබලයක් ඇතිවී ජීවිත හානි සහ අනතුරු සිදුවූ බව ප්‍රකාශ කරයි.

10) මහවැලි අධිකාරියේ වගකීම් විරහිත ක්‍රියාකලාපය හේතුවෙන් අනාගතයේදීද මෙවැනි ගංවතුර හා හානි වළක්වාගැනීම අපහසු බව ප්‍රකාශ කරයි. ජලය මුදාහැරීමට පෙර මිනිත්තු 10ක අනතුරු ඇඟවීමක් පමණක් ප්‍රමාණවත් නොවන බව සඳහන් කරයි.

11) වාරිමාර්ග දෙපාර්තුමේන්තුව 2025 නොවැම්බර් 27 දින ජල මුදාහැරීමේ ප්‍රවාහ අනුපාතය සහ ජලාශය පිරීමට ගතවන කාලය පිළිබඳ ගණනයන් ඉදිරිපත් කරමින් තම චෝදනාවට සහාය දක්වයි.

12) දණ්ඩ නීති සංග්‍රහයේ 293 සහ 294(අ) වගන්ති අනුව, මරණය සිදුවිය හැකි බව දනිමින්ම එම ක්‍රියාව සිදු කිරීම මිනිමැරුමක් ලෙස සැලකිය හැකි බව සඳහන් කරයි. තවදුරටත් , 294(අ) වගන්තිය අනුව, මරණය හෝ බරපතළ ශාරීරික හානි සිදුවිය හැකි බව දනිමින්ම එම ක්‍රියාව සිදු කිරීමෙන් සිදුවන මරණය මිනිමැරුමක් ලෙස සලකන බව සඳහන් කරයි.

13) 2005 යාන්ගල්මෝදර දුම්රිය අනතුර උදාහරණයක් ලෙස දක්වමින්, එකී නීතිමය තත්ත්වය සහ කොත්මලේ ජලාශයේ වාන් දොරටු විවෘත කිරීමේ ක්‍රියාවලිය අතර සමානකම් ඇති බවට පැමිණිලිකරු තර්ක කරයි.

ඉල්ලීම්:

1) මෙවැනි ගංවතුර තත්ත්වයන් වැනි ස්වභාවික විපත් තුළ සිදුවන ආපදාවන් අවම කර ගැනීමට හා වළක්වා ගැනීමට සුදුසු ස්ථිරසාර විසඳුම් ලබාදෙන ලෙස ඉල්ලා සිටියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

12(1) යටතේ ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට තීරණයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියි.

2) ගංවතුර තත්ත්වය හේතුවෙන් ජනතාවගේ රැකියා කිරීමේ නිදහස හා තමන් කැමති ස්ථානයක වාසය කිරීමේ නිදහසට බාධා සිදු වීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන මෙන් පැමිණිලිකරු ඉල්ලා සිටියි.

3) කොත්මලේ ජලාශයේ ජල පෝෂක ප්‍රදේශයේ අනවසර පදිංචිකරුවන් හෝ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටියි.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කල වාර්තාවේ සාරාංශය

පූර්විකාව සහ තාක්ෂණික පසුබිමය

ආයතනික සහයෝගීතාව: ලෝක කාලගුණ සංගමය (WMO) සහ ESCAP සහයෝගීතාවයෙන් ඉන්දියාවේ පිහිටුවා ඇති RSMC ආයතනය මගින් බෙංගාල බොක්ක සහ අරාබි මුහුදේ සුළි කුණාටු පිළිබඳ තාක්ෂණික සහාය සහ දත්ත ලබා දෙන බව පවසයි.

කාලගුණ අනාවැකි සහ අභියෝග පිළිබඳ සඳහන් කරමින් ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම, මධ්‍යම කඳුකරය සහ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා කාලගුණික වෙනස්කම් පූර්වයෙන් හඳුනාගැනීම සංකීර්ණ වී ඇති බව පවසයි.

සුළි කුණාටුවක් නිර්මාණය වන ආකාරය පැහැදිලි කරමින් වායුගෝලීය කැළඹීලි, අඩු පීඩන කලාප, පීඩන අවපාත සහ ගැඹුරු පීඩන අවපාත ලෙස ක්‍රමයෙන් වර්ධනය වීමෙන් සුළි කුණාටු නිර්මාණය වන බව පවසයි.

අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතිය (SOP ක්‍රියාපටිපාටිය)

- සුදු පැහැය (තොරතුරු නිවේදනය): පද්ධතිය පිළිබඳ පූර්ව දැනුවත් කිරීම.
- ඇම්බර් පැහැය (අවධානාත්මක නිවේදනය): පද්ධතිය සක්‍රිය වෙමින් පවතින බැවින් පූර්ව සූදානම අවශ්‍ය බව.
- රතු පැහැය (අනතුරු ඇඟවීම): ජීවිත හා දේපළ අවදානමක් පවතින බැවින් වහාම ක්‍රියාත්මක විය යුතු අවස්ථාව.

2025 නොවැම්බර් මස කාලගුණ පද්ධතිවල කාලානුක්‍රමික වර්ධනය

නොවැම්බර් 13 – 15:

නොවැම්බර් 13 වන දින දිවයිනට නැගෙනහිරින් හඳුනාගත් වායුගෝලීය කැළඹීලිය නොවැම්බර් 15 වන දින අඩු පීඩන කලාපයක් දක්වා වර්ධනය විය.

නොවැම්බර් 18 – 22 ("සෙන්යාර්" සහ "දෙවන අඩු පීඩන කලාපය"):

නොවැම්බර් 18 වන දින ගිනිකොණ බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ "සෙන්යාර්" සුළි කුණාටුව වර්ධනය වූ අතර, ධීවර ප්‍රජාව සඳහා විශේෂ නිවේදන නිකුත් කෙරිණි.

නොවැම්බර් 22 වන විට තවත් අලුත් අඩු පීඩන කලාපයක් නිර්මාණය වීමේ හැකියාව පූර්ව නිගමනය කරන ලදී.

නොවැම්බර් 23 – 25 ("දිට්වා" සුළි කුණාටුවේ ආරම්භක අවධිය):

නොවැම්බර් 23 වන දින දිවයින ආශ්‍රිතව අඩු පීඩන කලාපයක් නිර්මාණය වන බවට පූර්ව හඳුනාගැනීම සිදු කළ අතර Zoom තාක්ෂණය ඔස්සේ අදාල රාජ්‍ය ආයතන දැනුවත් කරන ලදී.

නොවැම්බර් 25 උදෑසන 10.00 ට ඇම්බර් නිවේදනයක්ද, සවස 03.45 ට "දිට්වා" පද්ධතිය සඳහා ප්‍රථම "රතු" අනතුරු ඇඟවීමේ නිවේදනයද (මි.මී. 150 ට වැඩි තද වැසි) නිකුත් කර බව පවසයි.

නොවැම්බර් 26 – 27 ("දිට්වා" සුළි කුණාටුව උච්චතම අවස්ථාවට පැමිණීම):

නොවැම්බර් 26 දින සිට දිවයින වටා මුහුදු ගමනාගමනයෙන් වළකින ලෙස දැනුම් දුන් අතර, ගාල්ල, හම්බන්තොට, පොතුවිල්, ත්‍රිකුණාමලය, යාපනය යන ස්ථානවලින් පැයෙන් පැයට දත්ත ලබාගැනීම සිදු කරන බව පවසන ලදී.

නොවැම්බර් 27 පෙ.ව. 08.30 ට මි.මී. 200 ට වැඩි ඉතා තද වැසි සහ අධි අවදානම් (High Risk) තත්ත්වයක් ඇතිවියහැකි බවට ප්‍රකාශයට පත් කරන ලදී.

නොවැම්බර් 27 ප.ව 05.00 වන විට මෙම පද්ධතිය "දිට්වා" (Ditwa) සුළි කුණාටුව දක්වා වර්ධනය වූ බව සනාථ කරමින් රතු නිවේදන නිකුත් කර ඇති බව පවසයි.

නොවැම්බර් 28 – 30 (බලපෑම අඩුවීම):

නොවැම්බර් 27 සිට 30 දක්වා කාලය තුළ SOP ක්‍රියාපටිපාටියට අනුව රතු නිවේදන 31 ක් නිකුත් නිකුත් කර ඇති බව පවසයි.

නොවැම්බර් 30 රාත්‍රී 09.00 වන විට "දිට්වා" සුළි කුණාටුව ශ්‍රී ලංකාවෙන් බැහැරට ගමන් කිරීමත් සමඟ අවදානම් මට්ටම ඇම්බර් දක්වා පහත හෙළන ලදී.

දෙසැම්බර් 01 – 03 (පද්ධතිය දුර්වල වී අවසන් වීම):

දෙසැම්බර් 01 වන දින "දිට්වා" සුළි කුණාටුව ගැඹුරු පීඩන අවපාතයක් දක්වා දුර්වල වූ අතර, දෙසැම්බර් 03 වන දින සවස 4.30 ට මෙහි අවසාන කාලගුණ නිවේදනය නිකුත් කරන ලදී.

<u>ආපදා කළමනාකරණය සහ පාර්ශවකාර ආයතන දැනුවත් කිරීම</u>

නොවැම්බර් 17, 20, 24, 26 සහ 27 යන දිනයන්හිදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, පොලිසිය, විදුලිබල මණ්ඩලය, ජලසම්පාදන මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු ප්‍රධාන රාජ්‍ය ආයතන දැනුවත් කරමින් විශේෂ සාකච්ඡා පවත්වන ලදී. නොවැම්බර් 26 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයේ අතිරේක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා මහජනතාව සෘජුවම දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී.

<u>වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කල වාර්තාවේ සාරාංශය.</u>

1) වාරිමාර්ග දෙපාර්තමේන්තුව
2) වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගැනු ලැබූ ක්‍රියාමාර්ග
3) වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන,
4) ගංගාධාරයන්ගේ ජල මට්ටමේ වල විචලනය නිරීක්ෂණය කිරීම

- වැව් ජලාශයන්ගේ ජල මට්ටම නිරීක්ෂණය
- වැඩි ජලය මුදා හැරීම
- විවිධ පාර්ශව දැනුවත් කිරීමට නිවේදන මුදා හැරීම

1. ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කල ඇති කාල සීමාව
    - ඊසාන දිග මෝසම් කාලය - නොවැම්බර් මස 15 - ජනවාරි 31
    - කටයුතු කල චක්‍රලේකය - 1978 අංක 42

2. ඒ අනුව අයහපත් කාලගුණය සැලකිල්ලට ගෙන නිලධාරීන්ගේ 2025.11.15- 2026.01.31 දක්වා කාලයේ දී නිවාඩු 2025.11.04 ලිපිය මගින් අවලංගු කොට පූර්ණ සූදානමකින් යුතුව කටයුතු කරන ලදී.

3. තවදුරටත් පුරෝකථනය කරන ලද කාලගුණික තත්ත්වයන් සම්බන්ධයෙන් දැනුවත් වීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය මගින් ප්‍රධාන කාර්යයන් පහක් සිදු කරන ලදී.

    i. ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය මගින් ගංගා ස්ථාන තුනකින් ජල මට්ටම් හා වර්ෂාපතන දත්ත ලබා ගනිමින්, ප්‍රධාන කාර්යාලය මගින් දිවා රාත්‍රී අඛණ්ඩව ජල මට්ටම් අධීක්ෂණය කර Dash Board එකෙන් පැය 24 ම ජීවමාන යාවත්කාලීන කිරීම් සිදු කරයි.

    ii. ආපදා තත්ත්වයන්හිදී, ලැබෙන ජල/වර්ෂාපතන දත්ත මත පදනම්ව ආපදා අනතුරු ඇඟවීමේ නිවේදන නිකුත් කරන කාලය තීරණය කරන අතර, සියලුම නිරීක්ෂණ

ස්ථාන අනුව එම නිවේදන සත්‍යාපනය කර මාධ්‍ය, ආපදා කළමනාකරණ ඒකක, පොලීසිය, ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යවා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ද පළ කරයි.

iii. කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ පුරෝකථනයට අනුව, උතුර, උතුරු-මැද, සබරගමුව, දකුණ, ඌව පළාත් ඇතුළු ප්‍රදේශවලට 2025.11.25 සිට 2025.11.30 දක්වා මි.මී. 200කට වඩා වර්ෂාපතනයක් අපේක්ෂිත වූ බැවින්, 2025.11.25 පෙ.ව. 9.00ට සියලුම ගංගා සඳහා ඇම්බර් මට්ටමේ ගංවතුර අනතුරු ඇඟවීමක් නිකුත් කර, අදාළ නිලධාරීන් හා පොදු ජනතාව කල් තියා දැනුවත් කරන ලදී.

iv. 2025.11.26 ප.ව. 2.00ට මහවැලි ගඟ ද්‍රෝණියට අදාළව ඇම්බර් මට්ටමේ ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදනය නිකුත් කරන ලද අතර, එහි වලංගුභාවය මුලින් පැය 48ක් ලෙස තිබූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත 2025.11.28 ප.ව. 2.20 දක්වා දීර්ඝ කරන ලදී

v. තවදුරටත් ජලවිද්‍යාත්මක දත්ත විශ්ලේෂණය හා කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරෝකථනය සමඟ සසඳමින්, නිවේදනය අංක 01 මහවැලි ගඟ ද්‍රෝණියේ තත්ත්වය නිවැරදිව පිළිබිඹු කළ බව තහවුරු විය.

vi. 2025.11.27 දින මහවැලි ගඟ පහත් බිම් සඳහා ගංවතුර අනතුරු ඇඟවීම් නිකුත් කර, ඉදිරි පැය 24 තුළ ගංවතුර අවදානමක් පවතින බව දැනුම් දෙන ලදී.

vii. ගංවතුර අනතුරු ඇඟවීමේ වලංගු කාලය 2025.11.28 දින ප.ව. 1.00 දක්වා දීර්ඝ කරන ලදී.

viii. 2025.11.28 දින ප.ව. 3.30ට ගංවතුර තත්ත්වය යාවත්කාලීන කරමින් තවත් අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදී.

ix. 2025.11.27 දින ප.ව. 6.00ට වෙනත් ප්‍රදේශයක් සඳහා ද ගංවතුර අනතුරු ඇඟවීමක් නිකුත් කරන ලදී.

x. 2025.11.29 දින නව ගංවතුර අනතුරු ඇඟවීමක් නිකුත් කර, ගංවතුර අනතුරු ඇඟවීමේ වලංගු කාලය 2025.12.01 දින ප.ව. 2.00 දක්වා තවදුරටත් දීර්ඝ කරන ලදී.

4. දෙපාර්තමේන්තුව ගංවතුර අනතුරු ඇඟවීමේ කාර්යපටිපාටිය අනුව අනතුරු ඇඟවීම් නිකුත් කර, අදාළ ආයතන දැනුවත් කරමින් තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී.
    i. අනතුරු ඇඟවීම් නිකුත් කිරීමේදී අදාළ ආයතන සහ නිලධාරීන් කඩිනමින් දැනුවත් කරන ලදී.
    ii. සන්නිවේදන ලේඛන යාවත්කාලීන කර නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.
    iii. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලීසිය සහ ත්‍රිවිධ හමුදාව වෙත නිවේදන යොමු කරන ලදී.
    iv. මාධ්‍ය හරහා පොදු ජනතාව ගංවතුර තත්ත්වය පිළිබඳ දැනුවත් කරන ලදී.
    v. ගංවතුර තත්ත්වය අඛණ්ඩව නිරීක්ෂණය කර අවශ්‍ය පරිදි නිවේදන යාවත්කාලීන කරන ලදී.
    vi. ගංවතුර මට්ටම් පිළිබඳ දත්ත ලේඛනගත කර වාර්තා තබන ලදී.
    vii. 2025.11.25 සිට 2025.12.01 දක්වා කාලය තුළ ගංවතුර අනතුරු ඇඟවීම් අඛණ්ඩව නිකුත් කරන ලදී.

5. ගංවතුර අනාවැකි කිරීමේ ක්‍රමවේදය සහ අදාළ දත්ත විශ්ලේෂණය පිළිබඳ විස්තර කරන ලදී.

6. අවසානයේ ක්‍රියාවලිය සම්බන්ධ නිගමන සහ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

7. වාරිමාර්ග දෙපාර්තමේන්තුව ජලාශවල ජල මට්ටම් සහ අතිරික්ත ජලය නිරන්තරයෙන් අධීක්ෂණය කර, 2025.11.26 සිට 2025.12.01 දක්වා අඛණ්ඩ වාර්තාකරණය සිදු කළේ ජනතාවට වන හානිය අවම කිරීම සඳහාය.

8. ජලාශවල ජල මට්ටම් පිළිබඳ දත්ත දිනකට කිහිප වතාවක් වට්ස්ඇප් සහ විද්‍යුත් තැපැල මගින් අදාළ රාජ්‍ය ආයතන හා මාධ්‍ය වෙත යොමු කරන ලදී.

9. ජල ගැලීම් සහ විදුලිබල ඇණහිටීම් වැනි දුෂ්කරතා මධ්‍යයේ පවා ක්ෂේත්‍ර නිලධාරීන් ජනතාවගේ ආරක්ෂාව සහ වාරි නිර්මිතවල සුරක්ෂිතභාවය තහවුරු කිරීමට කැපවී කටයුතු කළහ.

10. තාක්ෂණික කරුණු සහ ප්‍රායෝගික අත්දැකීම් මත පදනම්ව, අනාගතයේ මෙවැනි ආපදා තත්ත්වයන්ට මුහුණ දීම සඳහා සියලු පාර්ශවයන්ගේ සූදානම සහ සම්බන්ධීකරණය තවදුරටත් ශක්තිමත් කළ යුතු බව සඳහන් කර ඇත.

ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය විසින් එවන ලද වාර්තාවේ සාරාංශය

ඇමුණුම 01. සිද්ධිය පිළිබඳ විස්තරාත්මක වාර්තාව.

ඇමුණුම 02. පැමිණිල්ලට අදාළ තොරතුරු.

ඇමුණුම 03. දින හා ස්ථාන සම්බන්ධ සාක්ෂි ලේඛන.

ඇමුණුම 04. චෝදනාව සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග වාර්තාව.

ඇමුණුම 05. අනුබද්ධ ලේඛන.

ඇමුණුම 06. වැඩිදුර පැහැදිලි කිරීම් සහ අනුබද්ධ තොරතුරු

සිද්ධිය පිළිබඳ විස්තරාත්මක වාර්තාව

<u>ආපදා කලමනාකරණ මධ්‍යස්ථානයෙහි සාමාන්‍ය කාර්යභාරය</u>

ආපදා අවම කිරීම, පූර්ව සූදානම, පූර්ව අනතුරු ඇඟවීම්, හදිසි ප්‍රතිචාර, මුදාගැනීම් සම්බන්ධීකරණය සහ 24×7 හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය පවත්වාගෙන ගිය බව පවසයි .දිස්ත්‍රික් මට්ටමින් දිගුකාලීන ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.ඊශාන දිග මෝසම් වර්ෂාව සම්බන්ධයෙන් කාලගුණ, වාරිමාර්ග, මහවැලි, NBRO සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමඟ පැවති සම්බන්ධීකරණය පිළිබඳ පවසයි.

නොවැම්බර්–දෙසැම්බර් කාලය ඊශාන දිග මෝසම් වර්ෂාව ක්‍රියාශීලී වන සාමාන්‍ය කාලය බව සඳහන් කර ඇත.මෙවර කාලගුණ දෙපාර්තමේන්තුවෙන් ලිඛිත පූර්ව දැනුම්දීමක් ලැබී නොතිබිණි.අ.පො.ස. උසස් පෙළ විභාගය පැවැත්වීම හේතුවෙන් විභාග අපේක්ෂකයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සඳහා 2025.10.27 දින DMC අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් විශේෂ සම්බන්ධීකරණ රැස්වීමක් පවත්වා අදාළ ආයතන සහභාගී කරවා ගන්නා ලද බව පවසයි.

<u>ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය ගත් ක්‍රියාමාර්ග</u>

- ජනතාවගේ ජීවිත, දේපළ සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා NEFOP වැඩසටහන යටතේ විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී.
- පොලිසිය, ත්‍රිවිධ හමුදාව, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය සිදු කරන ලදී.
- අවශ්‍ය අවස්ථාවල විශේෂ අනතුරු ඇඟවීම් සහ නිවේදන නිකුත් කරන ලදී.
- Zoom රැස්වීම් පැවැත්වීම.

2025.11.17, 2025.11.20, 2025.11.24 සහ 2025.11.26 දින Zoom තාක්ෂණය ඔස්සේ විශේෂ සම්බන්ධීකරණ රැස්වීම් පවත්වන ලදී.2025.11.10 සිට 2025.11.26 දක්වා අදාළ සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

පැමිණිල්ලට අදාළ තොරතුරු

ආපදා අවම කිරීමේ කටයුතු සම්බන්ධ අමතර තොරතුරු ඇතුළත් කර ඇත.රථවාහන සහ ප්‍රවාහන අවහිරවීම් ඇතුළු ආපදා තත්ත්වයන්ට ගත් ක්‍රියාමාර්ග සහ NBRO සමඟ පැවති සම්බන්ධීකරණය පිළිබඳ පවසයි.දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ නිරන්තර සම්බන්ධීකරණය පවත්වාගෙන ගිය බව පවසයි.NBRO වාර්තා අනුව නායයෑම් අවදානම් කලාප හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.අවදානම් ප්‍රදේශවල ජනතාව ආරක්ෂිත ස්ථාන වෙත ඉවත් කිරීම සහ අවශ්‍ය සහන සැපයීම සිදු කරන ලදී.

දිස්ත්‍රික් මට්ටමේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති,

- දිගුකාලීන ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.
- නායයෑම් අවදානම් කලාප හඳුනාගෙන අවදානම අවම කිරීමට පියවර ගන්නා ලදී.
- ජල සහ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී.
- ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

සුළි කුණාටු පිළිබඳ ලේඛනයේ සාරාංශය

- කෙටි කාලීන කාලගුණ වෙනස්කම් සත්‍ය ලෙස පෙර හඳුනාගැනීමට ඇති හැකියාව අවස්ථානුකූලව වෙනස් වේ.

සුළි කුණාටු සෑදීමේ ක්‍රියාවලිය:

- සුළි කුණාටුවක් එකවර පැන නොනගින අතර, එය වායුගෝලීය කැළඹීම්, අඩුපීඩන කලාප සහ පීඩන අවපාතයේ තීරණාත්මක වර්ධනයක් ලෙස සිදුවේ.
- සුළි කුණාටු ඇතිවීම සාගර කලාපවලදී සිදුවන අතර, ඒ සඳහා තීරණාත්මක පාරිසරික ලක්ෂණ ගණනාවක් පැවතිය යුතුය.

සුළිකුණාටු වර්ධනයේ කාලරාමුව (2025 නොවැම්බර්)

නොවැම්බර් 23:

- අඩුපීඩන කලාපයක් නිර්මාණය විය හැකි බවත්, නොවැම්බර් 25 සිට වැසි තත්ත්වය තවදුරටත් පවතිනු ඇති බවත් සඳහන් කරමින් පළමු නිවේදනය නිකුත් කර ඇත.

නොවැම්බර් 24:

- නවතම තත්ත්වයන් පිළිබඳ නිවේදනයක් නිකුත් කර ඇත.
- Zoom තාක්ෂණය ඔස්සේ අදාළ පාර්ශවකරුවන් දැනුවත් කර ඇත.

නොවැම්බර් 25:

- උදැසන අඩුපීඩන කලාපය නිර්මාණය වූ අතර ඇම්බර් අවවාදාත්මක නිවේදනය නිකුත් කර ඇත.
- පස්වරුවේ දිවයිනේ ප්‍රදේශ කිහිපයකට මි.මී. 150ට වැඩි තද වැසි අනාවැකි සමඟ පළමු රතු අනතුරු ඇඟවීමේ නිවේදනය නිකුත් කර ඇත.
- රාත්‍රියේ රතු නිවේදනය යාවත්කාලීන කර මුහුදු ප්‍රදේශද ඇතුළත් කර ඇත.
- අඩුපීඩන කලාපය ඉදිරි පැය 30 තුළ පීඩන අවපාතයක් දක්වා වර්ධනය විය හැකි බව දැනුම් දී ඇත.

නොවැම්බර් 26:

- රතු අනතුරු ඇඟවීමේ නිවේදනය නවතම දත්ත සමඟ දිනකට දෙවරක් යාවත්කාලීන කර ඇත.
- අඩුපීඩන කලාපය පීඩන අවපාතයක් දක්වා වර්ධනය විය හැකි බවත් වැසි හා සුළං තත්ත්වය තවදුරටත් වැඩිවන බවත් නිවේදනය කර ඇත.
- ධීවර හා නාවික කටයුතුවලින් වැළකී සිටින ලෙස උපදෙස් ලබා දී ඇත.

ප්‍රාදේශීය නිරීක්ෂණ මධ්‍යස්ථාන:

සාමාන්‍යයෙන් පැය 3කට වරක් සිදු කරන නිරීක්ෂණ, නොවැම්බර් 26 සිට 29 දක්වා ගාල්ල, හම්බන්තොට, පොතුවිල්, ත්‍රිකුණාමලය සහ යාපනය මධ්‍යස්ථානවල පැයෙන් පැයට සිදු කර ඇත.

නොවැම්බර් 27:

- අඩුපීඩන කලාපය පීඩන අවපාතයක් දක්වා වර්ධනය වූ බව නිවේදනය කර ඇත.
- දිවයින පුරා මි.මී. 200ට වැඩි ඉතා තද වැසි අවදානමක් සහ පීඩන අවපාතය ඉදිරි පැය 12 තුළ ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය විය හැකි බව ඉහළ අවදානම් මට්ටමක් ලෙස ප්‍රකාශ කර ඇත.
- ගැඹුරු පීඩන අවපාතය තවදුරටත් සුළි කුණාටුවක් දක්වා වර්ධනය විය හැකි බව සඳහන් කරමින් රතු අනතුරු ඇඟවීමේ නිවේදනය නිකුත් කර ඇත.

සුළිකුණාටු පද්ධති තුනෙහි වර්ධන ඉතිහාසය

1. **2025 නොවැම්බර් 15 - දිවයින ආශ්‍රිතව වර්ධනය වූ අඩුපීඩන කලාපය**

දේශීය, කලාපීය, RSMC සහ ගණිතමය ආකෘති දත්ත මත පදනම්ව විශ්ලේෂණය සිදු කර ඇත. නොවැම්බර් 13 දින දිවයිනට අග්නිදිගින් වායුගෝලීය කැළඹීමක් හඳුනාගෙන එහි බලපෑම පිළිබඳ පළමු නිවේදනය නිකුත් කර ඇත.

නොවැම්බර් 15 දින එම කැළඹීම අඩුපීඩන කලාපයක් දක්වා වර්ධනය වූ බව නිවේදනය කර ඇත. නොවැම්බර් 18 දින සුදු වර්ණ විශේෂ නිවේදනයක් මගින් අඩුපීඩන කලාපය දිවයිනෙන් ඉවතට ගමන් කරන නමුත් වැසි වැඩි විය හැකි බව දැනුම් දෙන ලද බව පවසයි .

නොවැම්බර් 22 දින ගිනිකොණදිග බෙංගාල බොක්කේ නව අඩුපීඩන කලාපයක් නිර්මාණය විය හැකි බවත් එය ශ්‍රී ලංකාවට ආසන්න විය හැකි බවත් නිවේදනය කර ඇත.
ආපදා කළමනාකරණ පාර්ශවකරුවන් අඛණ්ඩව දැනුවත් කළ අතර, නොවැම්බර් 17 සහ 20 දින Zoom හරහා රැස්වීම් පවත්වන ලද බව පවසයි.

2. ගිනිකොණදිග බෙංගාල බොක්ක ආශ්‍රිතව වර්ධනය වූ "සෙන්යාර්" සුළි කුණාටුව

- පළමු නිවේදනය නොවැම්බර් 18 දින බහුදින ධීවර යාත්‍රා සඳහා නිකුත් කර ඇත.
- දිනපතා කාලගුණ අනාවැකි සහ ධීවර ජනතාව සඳහා තද සුළං හා රළු මුහුදු තත්ත්ව පිළිබඳ නිවේදන නිකුත් කරන ලද බව පවසයි .
- නොවැම්බර් 22–26 කාලයේ බෙංගාල බොක්කේ ගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා විශේෂ අනතුරු ඇඟවීම් නිකුත් කර ඇත.
- නිවේදන සෑම පැය 24කට වරක් යාවත්කාලීන කරන ලද බව පවසයි.

3. ශ්‍රී ලංකාවට ආසන්නයේ වෙමින් වර්ධනය වූ "දිට්වා" සුළි කුණාටුව

දේශීය, කලාපීය, RSMC සහ ගණිතමය ආකෘති දත්ත මත පදනම්ව විශ්ලේෂණය සිදු කරන ලද. බව පවසයි

"දිට්වා" සුළි කුණාටුවට හේතු වූ වායුගෝලීය කැළඹීම කාලගුණ විද්‍යාඥයින් විසින් මුල් අවස්ථාවේදීම හඳුනාගන්නා ලද බව පවසයි.

සුළි කුණාටු සෑදීමට අවශ්‍ය තත්ත්ව:

- උණුසුම් සාගර ජලය.
- අඩු සිරස් සුළං ව්‍යාකෘති (Low Vertical Wind Shear).
- පෘථිවියේ භ්‍රමණය හේතුවෙන් ප්‍රමාණවත් කොරියෝලිස් බලය (Coriolis Force).
- අන්තර් නිවර්තන අභිසාරී කලාපය (ITCZ).
- සමක තරංග සහ නැගෙනහිර තරංග.
- මෝසම් සමග ඇතිවන සාපේක්ෂව අඩු වායුගෝලීය පීඩනයක් සහිත දිගටි ප්‍රදේශ (Monsoon Troughs).

විද්‍යාත්මක ක්‍රියාවලිය:

උණුසුම් ජලවාෂ්ප සහ ජලවාෂ්ප ඝනීභවනයේදී මුදාහරින තාපය දැඩි ගිගුරුම් වැසි සහිත සුළිකුණාටු බවට භ්‍රමණය වන අඩුපීඩන පද්ධති පැවැතීම හා වර්ධනය වීමට අවශ්‍ය ශක්තිය සපයයි.

හඳුනාගැනීමේ ක්‍රමවේදය:

RSMC (Regional Specialized Meteorological Centre) හි සහාය ලබා ගත් බව පවසයි.

දේශීය දත්ත, **RSMC** දත්ත සහ ගෝලීය දත්ත පදනම් කරගෙන විශ්ලේෂණය සිදු කර ඇති බව පවසයි.

එමගින් පද්ධතියේ ස්වභාවය හඳුනාගනී.

අභියෝගය:

මුහුදු ප්‍රදේශවල වර්ධනය වන සියලුම කැළඹීම් සුළිකුණාටු බවට පත් නොවේ.

කැළඹීමක් සුළිකුණාටුවක් ලෙස වර්ධනය වන්නේද නැද්ද යන්න මුල් අවස්ථාවේදී නිශ්චිතව හඳුනාගැනීම අපහසුය.

පද්ධතියේ වර්ධනය හෝ දුර්වල වීම පියවරෙන් පියවර ඉහළ නිරවද්‍යතාවකින් නිරීක්ෂණය කළ හැක.

උතුරු ඉන්දීය සාගරයේ වර්ගීකරණය:

සුළි කුණාටු කැළඹීම් වර්ගීකරණය සඳහා නිර්ණායක වගුවක් (වගු අංක 01) භාවිතා කරයි.

එම නිර්ණායක මත පදනම්ව අනතුරු ඇඟවීමේ නිවේදන නිකුත් කර ඇති බව පවසයි.

සුළි කුණාටු වර්ගීකරණය හා නිවේදන ක්‍රමවේදය

වගුව 01 - උතුරු ඉන්දීය සාගරයේ සුළි කුණාටු වර්ගීකරණය: (උපරිම තිරසාර සුළං වේගය මත පදනම්ව)

කැළඹීම් වර්ගය වේගය:

අඩු පීඩන කලාපය (Low Pressure Area) <17 knots (<31 kmph)

පීඩන අවපාතය (Depression) 17–27 knots (31–49 kmph)

ගැඹුරු පීඩන අවපාතය (Deep Depression) 28–33 knots (50–61 kmph)

සුළි කුණාටුව (Cyclonic Storm) 34–47 knots (62–88 kmph)

චණ්ඩ සුළි කුණාටුව (Severe Cyclonic Storm) 48–63 knots (89–117 kmph)

ඉතා චණ්ඩ සුළි කුණාටුව (Very Severe Cyclonic Storm) 64–89 knots (118–167 kmph)

ප්‍රචණ්ඩ සුළි කුණාටුව (Extremely Severe Cyclonic Storm) 90–119 knots (168–221 kmph)

සුපිරි සුළි කුණාටුව (Super Cyclonic Storm) ≥120 knots (≥222 kmph)

කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිවේදන ක්‍රමවේදය:

- ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය ජාත්‍යන්තර SOPs (Standard Operating Procedures) අනුව නිවේදන නිකුත් කරයි.
- වර්ණ කේත ක්‍රමයක් භාවිත කරයි.
- සුදු - තොරතුරු නිවේදනය (දැනුවත් කිරීම).
- ඇම්බර් - අවධානාත්මක නිවේදනය (සූදානම් වීම අවශ්‍ය).
- රතු - අනතුරු ඇඟවීම (ජීවිත අවදානමක් ඇති බැවින් වහාම ක්‍රියා කළ යුතුය).

ආපදා කළමනාකරණ පාර්ශවකරුවන් සම්බන්ධතාව:

මහජනතාවට සහ ආපදා කළමනාකරණ පාර්ශවකරුවන්ට කඩිනමින් තොරතුරු ලබාදීම කාලගුණ විද්‍යාඥයින්ගේ ප්‍රධාන වගකීමකි.

එක් එක් නිවේදනයේ ස්වභාවය අනුව SOPs ක්‍රියාත්මක කරයි.

දීර්ඝකාලීන දත්ත විශ්ලේෂණය:

- නොවැම්බර් මාසය බෙංගාල බොක්කේ සුළිකුණාටු අවදානම වැඩිම කාලය ලෙස සැලකේ.
- 2025 නොවැම්බර් මාසයේ සංකීර්ණ කාලගුණික තත්ත්වයන් පැවතුණි.
- ප්‍රධාන කාලගුණික පද්ධති තුනක් නිරීක්ෂණය විය.
- පළමු පද්ධතිය අඩුපීඩන කලාපයක් ලෙස පමණක් වර්ධනය විය.
- දෙවන පද්ධතිය "සෙන්යා" ලෙස නම් කරන ලද සුළිකුණාටුවකි.
- තෙවන පද්ධතිය "දිට්වා" ලෙස නම් කරන ලද සුළිකුණාටුවකි.
- මෙම පද්ධති හඳුනාගත් මුල් අවස්ථාවේ සිටම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අනතුරු ඇඟවීමේ නිවේදන නිකුත් කළේය.

"දිට්වා" සුළිකුණාටුවේ අවසාන අවධිය හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම"දිට්වා" සුළිකුණාටුවේ වර්ධනය :

ගැඹුරු පීඩන අවපාතය, "දිට්වා" සුළිකුණාටුව දක්වා වර්ධනය විය හැකි බව නිවේදනය කරන ලදී.

එදිනම සවස 5.00 වන විට නව දත්ත සහිත යාවත්කාලීන නිවේදනය නිකුත් කර ඇත.

නොවැම්බර් 27: "දිට්වා" සුළිකුණාටුව වර්ධනය වීමේ රතු අනතුරු ඇඟවීම සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුවත් කර ඇත.

සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය (SOP) අනුව නිවේදන නිකුත් කිරීම:

ඉන් පසුව සෑම පැය තුනකටම වතාවක් නව තත්ත්වයන් සමගින් 2025-11-30 දිනය දක්වා මුළු රතු නිවේදන 31ක් නිකුත් කර බව පවසයි.

ප්‍රාදේශීය නිරීක්ෂණ දත්ත:

ප්‍රාදේශීය නිරීක්ෂණ දත්ත සහ දේශීය දත්ත අනුව, නොවැම්බර් 30 සවස්කාලය වනවිට "දිට්වා" සුළිකුණාටුව දිවයිනෙන් වඩාත් බැහැරට යමින් පැවති බවත් එදින රාත්‍රී 09.00ට නිකුත් කරන ලද "ඇම්බර්" වර්ණයෙන් යුතු අවවාදාත්මක නිවේදනය මගින් දිවයිනේ පවතින අවදානම් ස්වභාවය අඩුවූ බවත් දැනුම් දෙන ලදී.

දෙසැම්බර් 01:

"දිට්වා" සුළිකුණාටුව ගැඹුරු පීඩන අවපාතයක් දක්වා දුර්වල වූ අතර මෙම දිනයේදීත් පැය 6කට වරක් බැගින් "ඇම්බර්" වර්ණයෙන් යුතු අවවාදාත්මක නිවේදන තුනක් යාවත්කාලීන කරමින් නව තොරතුරු නිකුත් කර බව පවසයි.

මෙම පද්ධතියේ අවසාන නිවේදනය (නිවේදන අංක 36) දෙසැම්බර් 03 දින සවස 4.30ට නිකුත් කර ඇත.

පාර්ශවකාර ආයතන දැනුවත් කිරීම.

2025 නොවැම්බර් 17, 20, 24, 26, 27 දිනවල පහත සඳහන් ආයතනවල ආපදා කළමනාකරණයට අදාළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ඉදිරි කාලගුණ තත්ත්වය පිළිබඳ විශේෂ සාකච්ඡා පවත්වන ලද බව පවසයි.

මෙම දැනුවත් කිරීම් හමුවලදී දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද ඉදිරිපත් කිරීම්වල පිටපත් ඇමුණුම් ලෙස ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

<u>සාකච්ඡාවන්ට සහභාගී වූ ආයතන:</u>

1. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ එහි සියලුම දිස්ත්‍රික් නියෝජිතයින්
2. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
3. ජාතික ගොඩනැගිලි පර්යේෂණ මධ්‍යස්ථානය (NBRO)
4. ජල කළමනාකරණ ලේකම් කාර්යාලය
5. විදුලිබල මණ්ඩලය
6. ධීවර දෙපාර්තමේන්තුව
7. විභාග දෙපාර්තමේන්තුව
8. සෞඛ්‍ය අමාත්‍යාංශය
9. ශ්‍රී ලංකා වරාය අධිකාරිය

විශේෂ මාධ්‍ය සාකච්ඡාව:

2025 නොවැම්බර් 26 දින ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයේ අතිරේක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ සියළුම පාර්ශවකාර ආයතන වල සහභාගීත්වයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා විශේෂ මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන ලද බව පවසයි .

<u>මහවැලි අධිකාරිය විසින් ඉදිරිපත් කල වාර්තාවේ සාරාංශය</u>

ප්‍රධාන වේල් හා ජලාශ මෙහෙයුම් සම්බන්ධ කටයුතු මහවැලි අධිකාරිය විසින් සිදු කරන බව සඳහන් කරන අතර 2025.12.31 සිට 2026.01.29 දක්වා කාලයට අදාළ තොරතුරු මානව හිමිකම් කොමිෂන් සභාවට ලබා දී ඇත.

ප්‍රධාන කරුණු:

- ප්‍රධාන ජලාශවල ජල මට්ටම් නිරන්තරයෙන් නිරීක්ෂණය කරනු ලබයි.
- ජල මට්ටම් පිළිබඳ තොරතුරු අදාළ පාර්ශවයන්ට කාලෝචිතව දැනුම් දෙනු ලබයි.
- ජල නිකුත් කිරීම සහ මෙහෙයුම් තීරණ ආරක්ෂිත ජල මට්ටම් සීමා මත පදනම්ව ගනු ලබයි.

වේලි වලින් ජලය නිකුත් කිරීම සම්බන්ධ සටහන්:

2020.11.27.

2025.10.31.

2025.11.19.

2025.11.25.

2025.11.26.

ඉහත දිනයන්හි ජල නිකුත් කිරීම හා ජල මට්ටම් සම්බන්ධ තීරණ වාර්තා කර ඇත.

වේලි වල මෙහෙයුම් හා ජල මට්ටම් කළමනාකරණය:

2025.11.25 දින වර්ෂාපතන පූර්වකථන සැලකිල්ලට ගෙන ජලාශවල ප්‍රමාණවත් හිස් ධාරිතාවක් (විශේෂයෙන් කොත්මලේ ජලාශයේ) පවත්වාගෙන ගොස් තිබුණි.අපේක්ෂිත ජල ප්‍රමාණය රැස්කර ගැනීමට අවශ්‍ය ධාරිතාව ජලාශවල පැවති බව සඳහන් කරයි.

වේලි වල දොරටු විවෘත කිරීම (2025.11.26 සහ 27):

අධික වර්ෂාපතනය හේතුවෙන් ජලාශවල ජල මට්ටම් අනුව වේල් දොරටු විවෘත කිරීමේ තීරණ ගන්නා ලදී.

භාර ඉංජිනේරුවන් විසින් මාධ්‍ය, ප්‍රාදේශීය නිලධාරීන්, ආපදා කළමනාකරණ නිලධාරීන්, ශ්‍රී ලංකා පොලීසිය සහ WhatsApp මගින් අඛණ්ඩ දැනුවත් කිරීම් සිදු කරන ලදී.

ක්‍රියාවලි විස්තර:

සියලු අදාළ පාර්ශවයන් පූර්වයෙන් දැනුවත් කර වේලි දොරටු විවෘත කිරීමේ තීරණ ගන්නා ලදී.පවතින දත්ත සහ තොරතුරු විශ්ලේෂණය කර අදාළ ආයතන වෙත කාලෝචිතව දැනුම් දෙන ලදී. වැරදි ප්‍රචාර පාලනය කිරීම සඳහා WhatsApp හඬ පණිවුඩ සහ දුරකථන ඇමතුම් මගින් නිලධාරීන් දැනුවත් කරන ලදී.

ඉදිරි කටයුතු සඳහා නිර්දේශ:

- ජලවිද්‍යාත්මක ගණනයන් යාවත්කාලීන කර ජලාශවල පහළ ජල මාර්ගයේ උපරිම පිටාර මට්ටම නැවත තීරණය කිරීම.
- උපරිම පිටාර සීමාව තුළ සිදුකරන අනවසර ඉදිකිරීම් කඩිනමින් ඉවත් කිරීම සඳහා ක්‍රමවේද හා නීති සකස් කිරීම.
- ජලාශවල ඉහළ ජලපෝෂක ප්‍රදේශවල ස්වයංක්‍රීය වර්ෂාපතන මානයන් ස්ථාපනය කර ජලාශයට ලැබෙන ජල ප්‍රමාණය නිවැරදිව ගණනය කිරීම.
- මහවැලි ගඟ හා ප්‍රධාන අතු ගංගාවල ස්වයංක්‍රීය ජල මාපක සවි කර ජලාශයට ලැබෙන ජල ප්‍රමාණය ගණනය කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම.

සිව්වන පැමිණිලිකරු: එස්.එරන්ද ගුණදාස මයා විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ ඇති කරුණු, **(HRC/HO/4896/25)** වලට පිලිතුරු ලබා දෙමින් **මහවැලි අධිකාරිය සිය වාර්තාවෙහි පහත කරුණු දක්වා සිටියි.**

කොත්මලේ ජලාශයේ ප්‍රධාන අරමුණ ජල විදුලි නිෂ්පාදනය වන අතර, ගංවතුර පාලනයද එහි අරමුණක් බව සඳහන් කරන **පැමිණිලිකරුට** පිලිතුරු ලබා දෙමින්,
කොත්මලේ ජලාශයේ මුලික අරමුණ:

- ජල විදුලිය නිපදවීම, මහවැලි (H) සහ (G) කලාපවලට වාරි ජලය සැපයීම සහ මහනුවර, මාතලේ, අනුරාධපුර යන දිස්ත්‍රික්කවල පානීය ජල අවශ්‍යතාව සපුරාලීමයි.
- වාන් දොරටු ක්‍රියාත්මක කිරීම: ජලාශයේ ජල මට්ටම වාන් මට්ටමට ආසන්න වන විට, ජලාශයේ සහ එහි නිර්මිතවල ආරක්ෂාව සඳහා වාන් දොරටු මගින් ජලය නිකුත් කිරීම ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයේ අධ්‍යක්ෂවරයාගේ, කාර්යභාර ඉංජිනේරුවරයාගේ සහ කාර්ය මණ්ඩලයේ වගකීමකි.
- වාන් මට්ටමට පහළින් ඇති විට ජලය නිකුත් කිරීම ජල කළමනාකරණ ලේකම් කාර්යාලය මගින් මෙහෙයවනු ලබන බවට සඳහන් කරයි.

ජලය මුදාහැරීමෙන් පහළ ප්‍රදේශවල ජනතාවගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමේ වගකීම නිසි ලෙස ඉටු නොකළ බවට පැමිණිලිකරු නගන චෝදනාව ප්‍රතික්ෂේප කරන අතර, රාජ්‍ය ආයතනයක් ලෙස **මහවැලි අධිකාරිය** මිනිස් ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමට සෑම අවස්ථාවකදීම කටයුතු කරන බව දක්වයි.

පැමිණිලිකරු 2025 නොවැම්බර් 27 දින වාන් දොරටු හදිසියේ විවෘත කිරීමෙන් විශාල ජල ප්‍රමාණයක් මහවැලි ගඟට එකතු වී ගම්පොල ප්‍රදේශයට දැඩි ගංවතුර තත්ත්වයක් ඇති වූ බවට ප්‍රකාශ කරයි. එම ගංවතුර හේතුවෙන් විශාල ජීවිත හා දේපළ හානි සිදු වූ බව සඳහන් කරයි. මෙම සිද්ධිය ස්වාභාවික ආපදාවක් නොව, නිලධාරීන්ගේ ක්‍රියාකලාපයේ ප්‍රතිඵලයක් බවට පැමිණිලිකරු චෝදනා කරයි.

තවදුරටත්,ජලාශයෙන් විශාල ජල ප්‍රමාණයක් එකවර මුදාහැරීමෙන් පහළ ප්‍රදේශවල ක්ෂණික ගංවතුර තත්ත්වයක් සහ ජීවිත හා දේපළ හානි සිදුවිය හැකි බව දැනුවත්වම, එසේ ක්‍රියා කළ බවට චෝදනා කරයි.මෙම චෝදනාවන් ද්විත්වයම **මහවැලි අධිකාරිය** සෘජුවම ප්‍රතික්ෂේප කරයි.

2025 නොවැම්බර් 27 දින ජලය පූර්ව දැනුම්දීමකින් තොරව මුදාහැර ඇති බවත්, ජලයෙන් යටවිය හැකි ප්‍රදේශ හඳුනාගෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී වසම් දැනුවත් කිරීමේ වගකීම ඉටු නොකළ බවත්, පැමිණිලිකරු චෝදනා කරයි.

පැමිණිලිකරුගේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමින් මහවැලි අධිකාරිය පහත කරුණු දක්වයි.

I. ජනතාව දැනුවත් කිරීම: කොත්මලේ ජලාශයේ ජල මට්ටම ඉහළ යාම සහ වාන් දොරටු ස්වයංක්‍රීයව විවෘත වීම සම්බන්ධයෙන් මාධ්‍ය ආයතන, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, පොලිස් ස්ථානාධිපතිවරුන් ඇතුළු පාර්ශව වෙත ලිපි මගින් නොවැම්බර් 26 වන දින දැනුම් දී ඇත. කොත්මලා ඔය සහ මහවැලි ගඟ ආශ්‍රිත පහළ ප්‍රදේශවල ජනතාවට ගඟ පරිහරණය නොකරන ලෙසත් විමසිලිමත්ව සිටින ලෙසත් දැනුම් දී ඇත.

II. WhatsApp සමූහ මගින් තොරතුරු යාවත්කාලීන කිරීම: ආපදා කළමනාකරණ කටයුතු සඳහා රාජ්‍ය නිලධාරීන් 194 දෙනෙකුගෙන් සමන්විත Disaster Management Community, Kandy WhatsApp සමූහය ඇතුළු තවත් සමූහ හරහා නිලධාරීන් නිරන්තරයෙන් දැනුවත් කර ඇත. එම නිසා වාන් දොරටු විවෘත කිරීම හදිසියේ සිදු වූවක් නොවන බවත් අදාල රේඛීය පාර්ශවයන් නිරන්තර දැනුවත් කිරීමෙන් පසු සිදුවූ ක්‍රියාවලියක් බවත් පවසයි.

III. අවදානම් ප්‍රදේශවල ජනතාව ඉවත් නොකර ජලය මුදාහැරීම හේතුවෙන් සිදුවූ ජීවිත හා දේපළ හානි සඳහා මහවැලි අධ්‍යක්ෂ ජනරාල්, ජලාශ භාර ඉංජිනේරුවරයා සහ කාර්ය මණ්ඩලය වගකිව යුතු බවට පැමිණිලිකරු චෝදනා කරයි. තවදුරටත්,ජලය මුදාහැරීමට පෙර සයිරන් අනතුරු ඇඟවීමක් නිකුත් නොකිරීම නිසා ප්‍රදේශවාසීන්ට වාන් දොරටු විවෘත

වූ බව දැනගැනීමට නොහැකි වූ බවට පැමිණිලිකරු චෝදනා කරයි. පැමිණිලිකරුගේ උක්ත චෝදනාවන් ද්විත්වයම ප්‍රතික්ෂේප කරයි දෙවන චෝදනාවට පෙර කරුණ යටතේ පිළිතුරු ලබා දී ඇති බව පවසයි.

IV. විශාල ජල ප්‍රමාණයක් මුදාහැර පසුව වාන් දොරටු වසා දැමූ බවට චෝදනා කරයි.පසුදින සයිරන් නාද කළද පෙරදින එය සිදු නොකිරීම වගකීම පැහැර හැරීමක් බව සඳහන් කරයි. එම සිද්ධියෙන් ජනතාව අතර දැඩි කලබලයක් ඇතිවී ජීවිත හානි සහ අනතුරු සිදුවූ බවට පැමිණිලිකරු චෝදනා කරයි.පැමිණිලිකරුගේ මෙම චෝදනාව ප්‍රතික්ෂේප කරමින් **මහවැලි අධිකාරිය** , නොවැම්බර් 27 වන දින සයිරන් නළාව නාද කළ ආකාරය පෙරදී දක්වා ඇති බවත්, පසුගිය වසරවල ද වාන් දොරටු විවෘත කිරීමට පෙර සයිරන් නළා නාද කර ජනතාව දැනුවත් කර ඇති බවත් දක්වයි.

V. මහවැලි අධිකාරියේ වගකීම් විරහිත ක්‍රියාකලාපය හේතුවෙන් අනාගතයේදීද මෙවැනි ගංවතුර හා හානි වළක්වාගැනීම අපහසු බව පැමිණිලිකරු ප්‍රකාශ කරයි. ජලය මුදාහැරීමට පෙර මිනිත්තු 10ක අනතුරු ඇඟවීමක් පමණක් ප්‍රමාණවත් නොවන බව තවදුරටත් සඳහන් කරයි. **මහවැලි අධිකාරිය** මෙයට පිළිතුරු දෙමින්, කොත්මලේ ජලාශය 1985 වසරේ ඉදිකිරීම් අවසන් කළ තැන් පටන් බොහෝ අවස්ථාවල වාන් දැමීම සිදු වී ඇත. නමුත් 2025 නොවැම්බර් මස ඇති වූ "දිට්වා සුළි කුණාටුව" යටතේ ලැබුණු අධික වර්ෂාව මීට පෙර සිදු නොවූ තත්ත්වයක් බවත්, එමගින් මහවැලි ගඟ සහ අතු ගංගා පිටාර මට්ටමට පැමිණි බවත් දක්වයි. විධිමත් වැඩපිළිවෙලක් සියලු ආයතනවල රාජ්‍ය නිලධාරීන් හා එක්ව සිදු කරන බවත්, එහිදී රාජ්‍ය නිලධාරීන්ට මෙන්ම මහජනතාවට ද විශාල වගකීමක් ඇති බවත් **මහවැලි අධිකාරිය** දක්වයි.

VI. **මහවැලි අධිකාරිය** 2025 නොවැම්බර් 27 දින ජල මුදාහැරීමේ ප්‍රවාහ අනුපාතය සහ ජලාශය පිරීමට ගතවන කාලය පිළිබඳ ගණනයන් උපුටා දක්වමින් පැමිණිලිකරු තම චෝදනාවට සහාය දක්වයි. පැමිණිලිකරු විසින් සිදු කර ඇති ගණනය කිරීම් සමග එකඟ නොවන බව දක්වමින් එම ප්‍රකාශය ප්‍රතික්ෂේප කරයි. කොත්මලේ ජලාශය විදුලි බල උත්පාදනය, වාරි ජලය සහ පානීය ජලය සැපයීමේ විභවයක් වන බැවින්, ජලාශයේ ජලය අඩු කිරීම ජල කළමනාකරණ කමිටුවේ තීරණවලට යටත්ව සිදු කළ යුතු බව දක්වයි.

VII. පැමිණිලිකරු දණ්ඩ නීති සංග්‍රහයේ 293 සහ 294(අ) වගන්ති අනුව, මරණය සිදුවිය හැකි බව දනිමින්ම එම ක්‍රියාව සිදු කිරීම මිනීමැරුමක් ලෙස සැලකිය හැකි බවට සඳහන් කරයි. **මහවැලි අධිකාරිය** පැමිණිලිකරුගේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කරයි.

VIII. 294(අ) වගන්තිය අනුව, මරණය හෝ බරපතළ ශාරීරික හානි සිදුවිය හැකි බව දනිමින්ම ක්‍රියා කිරීමෙන් සිදුවන මරණය මිනිමැරුමක් ලෙස සලකන බව පැමිණිලිකරු සඳහන් කරයි. නිලධාරීන් දිවා රාත්‍රී නොබලා, තම පෞද්ගලික ජීවිත ද නොසලකා අවදානම් සහිත අවස්ථාවන්හිදී රාජකාරි ඉටු කළ අතර, එවැනි නිලධාරීන්ට එරෙහිව මෙවැනි චෝදනා නැගීම පිළිබඳ **මහවැලි අධිකාරිය සිය** කණගාටුව පළ කරයි. මහවැලි ජලාශ භාර ඉංජිනේරුවන් සහ කාර්ය මණ්ඩලය සියලු කටයුතු සිදු කර ඇත්තේ මිනිස් ජීවිත හා දේපළ ආරක්ෂා කර ගැනීම උදෙසා බැවින් මෙම චෝදනා අදාළ නොවන බව **මහවැලි අධිකාරිය** තවදුරටත් දක්වයි

IX. 2005 යාන්ගල්මෝදර දුම්රිය අනතුර උදාහරණයක් ලෙස දක්වමින්, එහි නීතිමය තත්ත්වය සහ කොත්මලේ ජලාශයේ වාන් දොරටු විවෘත කිරීමේ ක්‍රියාවලිය අතර සමානකම් ඇති බවට පැමිණිලිකරු තර්ක කරයි.යාන්ගල්මෝදර සිද්ධිය කිසිසේත්ම මෙයට සමාන කළ නොහැකි බවත්, මෙම සිදුවීම් දෙක එකිනෙකට වෙනස් බවත් **මහවැලි අධිකාරිය** දක්වයි.

මෙවැනි ගංවතුර තත්ත්වයන් නැවත ඇති නොවීමට ස්ථිරසාර විසඳුම් ලබාදෙන ලෙස පැමිණිලිකරු ඉල්ලා සිටියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) යටතේ ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට තීරණයක් ලබාදෙන ලෙස පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටියි.ගංවතුර තත්ත්වය හේතුවෙන් ජනතාවගේ රැකියා කිරීමේ නිදහස හා තමන් කැමති ස්ථානයක වාසය කිරීමේ නිදහසට බාධා සිදු වූ බවට ප්‍රකාශ කරන ලෙසත්, කොත්මලේ ජලාශයේ ජල පෝෂක ප්‍රදේශයේ අනවසර පදිංචිකරුවන් හෝ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට පියවර ගන්නා ලෙසත් පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටියි. මහවැලි අධිකාරියේ නිලධාරීන් විසින් ප්‍රකාශ කර සිටින්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) යටතේ කියවෙන වගන්ති උල්ලංඝනය කර නොමැති බව දක්වයි.

අතිරේක නිරීක්ෂණ සහ යෝජනා

මහවැලි අධිකාරියේ වගකීම හා ධාරිතාව: 1979 පාර්ලිමේන්තු පනත් අංක 23 යටතේ පිහිටුවන ලද කොත්මලේ ජලාශය මීටර් මිලියන 170.898 ක ධාරිතාවකින්, මීටර් 87 ක උපරිම උසකින් සහ වාන් දොරටු 3 කින් යුක්ත වේ. එය 5,550 m^3/s ක ජල ප්‍රමාණයක් ආරක්ෂිතව මුදාහැරීමට හැකි වන සේ නිර්මාණය කර ඇත.

පැමිණිල්ලේ සඳහන් යෝජනා: "දිට්වා" කුණාටුවෙන් පසු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඇතුළු රේඛීය ආයතන සමග එක්ව ඉදිරියේදී සිදු කිරීමට නියමිත බව දක්වා ඇත.

කරුණු විශ්ලේෂණය

දිට්වා සුළි කුණාටුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2026.07.22 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය,කොමසාරිස් නිමල් ජී. පුංචිහේවා ,කොමසාරිස් ටී. තණරාජ් , අධ්‍යක්ෂ (පරීක්ෂණ හා විමර්ශන) සුමනලාල් වීරසිංහ, මානව හිමිකම් නිලධාරී මේබලා හෙට්ටිආරච්චි යන නිළධාරීන්ගේ ප්‍රධානත්වයෙන් සහ පැමිණිලිකාර ආචාර්ය අජන්තා පෙරේරා, සී. අමරසිංහ මහතාගේ සහ වගඋත්තරකාර රාජ්‍ය ආයතන වන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව/මධ්‍යස්ථානය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොත්මලේ ජලාශය භාර අධ්‍යක්ෂ, මහවැලි අධිකාරියේ නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වුනු සාකච්ඡාවේදී ඉදිරිපත්වූ කරුණු මෙම විශ්ලේෂණයේදී ඇතුලත් වේ.

2025.11.26 දින කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සෙන්යාර් සුළිකුණාටුවක් ගැන සඳහන් කරත් 2026.11.27 පෙ.ව 8.00 ට ඉන්දියාව සුළි කුනාටුවක් ආරම්භ වූ බවත් එහි නම දිට්වා ලෙසත් පැහැදිලිව සඳහන් කර තිබියදීත්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පස්වරු 1.00 ට සිදුකළ දැනුම් දීමේදී ,ඉදිරි පැය දොළහ තුළ සුළිකුණාටුවක් ඇතිවිය හැකි බවට පැවසීම තුළ යම්කිසි ප්‍රමාදයක් පවතින බවට පෙත්සම්කාරිය චෝදනා කරයි.

තවදුරටත්, එකී නිවේදනයේ වෙරළ ආශ්‍රිත පදිංචිකරුවන් සුදුසු ස්ථානවලට යෑමටත් අනෙකුත් පදිංචිකරුවන් නිවාස තුළට වී සිටීමටත් යන ශීර්ෂය යටතේ සිදු කරන ලද දැනුවත් කිරීම හේතුවෙන් නාය යෑම් අවදානම් ඇති පළාත්වල ජනතාවට මීට වඩා නිශ්චිතව අවදානම් තත්ත්වය දැනුම්දීම සිදුකළ යුතුව තිබූ බවට පෙත්සම්කාරිය සිය පැමිණිල්ලෙන් ඉදිරිපත් කර සිටියි.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත සිය චෝදනාව යොමු කරමින් පෙත්සම්කාරිය ප්‍රකාශ කර සිටින්නේ, මඩකලපුව පොළොන්නරුව මාර්ගයේ ජනතාවට දැඩි විමසිල්ලෙන් පසු වන ලෙස අනතුරු ඇඟවීම් නිකුත් කළද එම ප්‍රදේශයෙන් ඉවත්වීමට අනතුරු ඇඟවීම් නිකුත් කළ නොමැති බව පවසයි.

තවදුරටත් ජලාශ වල වාන් දොරටු විවෘත කිරීම හා ජලාශ හා ගංගා ආශ්‍රිත ජනතාවට අනතුරු ඇගවීම් නිකුත් කිරීමට ප්‍රමාද වූ බවට පවසන පෙත්සම්කාරිය බදුලු ආශ්‍රිත ජනතාවට අනතුරු ඇඟවීමේ නිවේදනය 2026.11.27 දින ප.ව 3.30 දැනුම් දුන් බවත්, ප.ව 6.00 ට විමසිලිමත් ලෙස සිටින ලද දැනුත් දුන් බවත් පසුව රාත්‍රී 9.00 ට මිනිසුන්ට හැකි ඉක්මනින් ඉවත් වන ලෙස දැනුම් දුන් බවත්, වාන් දෙරටු රාත්‍රී 9.05 ට විවෘත කළ බවත් මේ හේතුවෙන් විශාල පිරිසකට ජීවිත අහිමි වූ බවත් පවසයි.

මහවැලියේ වාන් දොරටු විවෘත කිරීමේදී **සයිරන් නාද** නොකල බවත් whatsapp group මාර්ගයෙන් දැනුවත් වූ බවත් මෙවැනි සමාජ මාධ්‍ය පරිශීලනය නොකරන්නන්ට එකී පණිවිඩය ලබාගැනීමේ මාර්ගයක් නොතිබූ බවත් පෙත්සම්කාරිය පවසයි.

ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත සිය චෝදනාව යොමු කරමින් පෙත්සම්කාරිය පවසා සිටින්නේ, මෙම දෙපාර්තමේන්තුව විසින් මිලියන 274 ක ව්‍යාපෘති කර ඇතත් ,දිට්වා සුළි කුනාටුවෙන් හානියට ලක් වූ ප්‍රදේශවල ව්‍යාපෘති සිදු නොකළ බවත්ය.සුළි කුනාටුවට පෙර සාකච්ඡා හතරක් පවත්වා ඇති නමුත් එකී සාකච්ඡා වලින් පවා ප්‍රමාණවත් පූර්ව සූදානමක් සිදු නොකර ඇති බව පවසන පෙත්සම්කාරිය පණිවිඩ හුවමාරු ක්‍රමය (email)විද්‍යුත් තැපැල සිදු කිරීම සාර්ථක නොවන බවත් එවැනි හදිසි අවස්ථාවකදී අන්තර්ජාල පහසුකම් බිඳ වැටෙන බවත් මෙවැනි අවස්ථාවක පණිවිඩ හුවමාරු කිරීමට ක්ෂණික යාන්ත්‍රණයක් පැවතිය යුතු බවත් සිය අදහස් දක්වයි. **තවදුරටත්,**පෙත්සමකාරිය **ෂෙල්ටර් (ආරක්ෂිත ස්ථාන) සූදානම් නොකිරීම දිය මෙය රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණයේ පවතින අස්ථාවරභාවයේ ප්‍රතිඵලයක් ලෙස හඳුනා ගනියි.**

සන්නිවේදන හා හදිසි ප්‍රතිචාර පද්ධති සම්බන්ධ ගැටලු මතුකරමින් දෙවන පෙත්සම්කාර **සී.අමරසිංහ** මහතා ප්‍රකාශ කරසිටින්නේ, **අදාළ අවස්ථාවේදී සන්නිවේදන පද්ධතිය සම්පූර්ණයෙන්ම පාහේ බිඳවැටී තිබූ අතර, ජනතාව දැනුවත් කිරීම සඳහා භාවිත කළ යුතු සයිරන් පද්ධතියද ක්‍රියාත්මක වී නොතිබුණි. දුරකථන සංඥා නොතිබීම, විදුලිබල සැපයුම විසන්ධි වීම සහ නිවෙස්වල ස්ථාවර දුරකථන (Fixed Line) සේවා ක්‍රියා විරහිත වීම හේතුවෙන් විශේෂයෙන්ම වයෝවෘද්ධ පුද්ගලයන් සමඟ සම්බන්ධ වී ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීමට දැඩි අපහසුතාවක් ඇති විය.**

තවද, ඉන්ධන ලබාගැනීම සඳහා පෙට්‍රල් පිරවුම්හල් වෙත ගිය අවස්ථාවලදීද විදුලිබලය නොතිබීම හේතුවෙන් ඉන්ධන නිකුත් කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීමට නොහැකි වූ අතර, එමඟින් ප්‍රවාහන කටයුතු පවත්වාගෙන යාමටද බාධා ඇති විය.

මෙවැනි හදිසි ආපදා තත්ත්වයන්හිදී සන්නිවේදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහ කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා පොලිස් ස්ථානවල සන්නිවේදන පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන්ම විදුලිබලය සහ සාමාන්‍ය දුරකථන ජාල අක්‍රිය වූ අවස්ථාවලදී භාවිත කළ හැකි විකල්ප සන්නිවේදන ක්‍රම සහ උපකරණ ස්ථාපිත කිරීම, හදිසි දැනුම්දීම් සඳහා සයිරන් පද්ධති නිසි පරිදි නඩත්තු කිරීම සහ ඒවායේ ක්‍රියාකාරීත්වය නිරන්තරයෙන් පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව යෝජනා කරසිටියි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමන්ගේ නිරීක්ෂණ තුළින්,අවදානම් සහිත අවස්ථාවලදී නිලධාරීන් විසින් වගකීමෙන් හා ප්‍රවේශම් සහගතව වචන භාවිත කළ යුතු බවත් ,

සිද්ධියේ බරපතලකම සහ පවතින අවදානම පිළිබඳව ජනතාවට පැහැදිලි හා නිවැරදි තොරතුරු කඩිනමින් සන්නිවේදනය කළ යුතු බවත් සභාපති අවධාරණය කරන ලදී.ආපදා තත්ත්වයකට පෙර ජනතාවට යොමුවිය හැකි ආරක්ෂිත ස්ථාන හඳුනාගෙන, ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ඇතුළුව නිසි පෙර සූදානමක් පැවතීම අත්‍යවශ්‍ය බව පෙන්වා දෙනලදී.රජයේ නිලධාරීන් විසින් තම වගකීම් නිසි පරිදි ඉටු නොකරන අවස්ථාවලදී, ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට සහ අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීමට කොමිෂන් සභාවට පවතින බලතල පිළිබඳව අවධාරණය කළ අතර ගංවතුරෙන් හානි වූ ප්‍රදේශවල අතහැර දමා තිබූ වාහන සම්බන්ධයෙන් කොල්ලකෑම් හා අනවසරයෙන් දේපළ ලබාගැනීමේ සිදුවීම් නිරීක්ෂණය වී ඇති බව පෙන්වා දුන්නේය.ආපදා කළමනාකරණය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේදී සිදුවී ඇති ප්‍රමාදයන් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා සිටි අතර සෙන්යා සහ දිට්වා ඇතුළු පිට පිට ඇති වූ සුළි කුණාටු තුන සම්බන්ධයෙන් ජනතාවට ප්‍රමාණවත්, පැහැදිලි සහ කාලෝචිත තොරතුරු ලබා දී තිබුණේද යන්න පිළිබඳව විමසීය.

සාකච්ඡාවේදී ඉදිරිපත් වූ කරුණු විශ්ලේෂණයේදී, ප්‍රශ්නගත සිදුවීම්වල කාලරාමුව සහ සාකච්ඡාවේදී ඉදිරිපත් වූ කරුණු

සාකච්ඡාවේදී ඉදිරිපත් වූ තොරතුරු අනුව, අදාළ ආපදා තත්ත්වයට පෙර සිටම කාලගුණික කැළඹීම් හඳුනාගෙන තිබූ අතර, එම තොරතුරු විවිධ අවස්ථාවලදී මාධ්‍ය සහ අදාළ ආයතන හරහා සන්නිවේදනය කර තිබුණි. කෙසේ වෙතත්, අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, ඒවා ජනතාව වෙත ළඟා වීම සහ ආයතන අතර තොරතුරු හුවමාරු කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාදයන් සහ සම්බන්ධීකරණ දුර්වලතා පැවති බව සාකච්ඡාවේදී අනාවරණය විය.

නොවැම්බර් 13 : කාලගුණික කැළඹිලි ස්වභාවයක් හඳුනාගෙන මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කරන ලදී.

නොවැම්බර් 15 : එම කැළඹිලි තත්ත්වය සම්පූර්ණයෙන්ම පහව ගිය බව වාර්තා විය.

නොවැම්බර් 17–18 : සෙන්යා කුණාටුව හඳුනාගත් අතර, එය මුලින් පුරෝකථනය කළ මාර්ගයේ ගමන් නොකළ බව සාකච්ඡාවේදී සඳහන් විය. එම අවස්ථාවේදී අ.පො.ස. (උසස් පෙළ) විභාග කාලය පැවති බැවින්, සිසුන්ගේ ආරක්ෂාව ප්‍රමුඛ කරමින් ධීවර ප්‍රජාව දැනුවත් කිරීම සිදුකර තිබුණි.

නොවැම්බර් 21: ඉන්දියානු කාලගුණ බලධාරීන් විසින් පෙ.ව. 11.30ට නැවතත් මෙම තත්ත්වය කැළඹිල්ලක් ලෙස හඳුනාගෙන තිබුණි.

නොවැම්බර් 23 : නැවතත් කාලගුණික කැළඹිලි තත්ත්වයක් හඳුනාගන්නා ලදී.

නොවැම්බර් 24 : අදාළ තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡා/රැස්වීම් පවත්වන ලදී.

නොවැම්බර් 25 : තත්ත්වය අඩු පීඩන කලාපයක් බවට වර්ධනය විය හැකි බවට අනතුරු ඇඟවීම් නිකුත් කළ අතර, තද වැසි පිළිබඳ අනතුරු ඇඟවීමක් සහ රතු නිවේදනයක් නිකුත් කරන ලදී.

නොවැම්බර් 26 : තත්ත්වය ගැඹුරු පීඩන අවපාතයක් බවට වර්ධනය විය හැකි බවට අනතුරු ඇඟවූ අතර, කොත්මලේ ජලාශයේ ජල මට්ටම සම්බන්ධයෙන්ද තොරතුරු හුවමාරු විය. පෙ.ව. 11.00ට ජලාශයේ වාන් දොරටු ස්වයංක්‍රීයව විවෘත වීම පිළිබඳව දැනුම් දෙන ලදී.

නොවැම්බර් 27 : පෙ.ව.: ඉන්දියානු කාලගුණ බලධාරීන් විසින් පෙ.ව. 8.00ට කුණාටු තත්ත්වයක් ආරම්භ වී ඇති බව ප්‍රකාශ කර, එයට "දිට්වා" යන නම ලබා දී ඇත. ශ්‍රී ලංකා කාලගුණ බලධාරීන් විසින් ප.ව. 1.00ට ඉදිරි පැය 12 තුළ කුණාටු තත්ත්වයක් වර්ධනය විය හැකි බව සඳහන් කර ඇත.

නොවැම්බර් 27 : පෙ.ව. 11.30: අභ්‍යන්තර දත්ත විශ්ලේෂණය මත කුණාටු තත්ත්වයක් බව තහවුරු කරගත් බව සාකච්ඡාවේදී සඳහන් විය. කුණාටුවට නිල නාමය ලබාදීම ඉන්දියානු බලධාරීන් විසින් සිදුකර ඇත.

නොවැම්බර් 27 : ප.ව. 2.00: ඉන්දියානු බලධාරීන් විසින් නිල නිවේදනය නිකුත් කරන ලදී.

නොවැම්බර් 27: ප.ව. 2.00: කොත්මලේ ජලාශය අවට උලපනේ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා පෝස්ටර් ප්‍රසිද්ධ කිරීම සිදුකර තිබුණි.

නොවැම්බර් 27 ප.ව. 3.30: බදුලු ඔය ආශ්‍රිත ප්‍රදේශවල ජනතාවට අනතුරු ඇඟවීම් ලබා දෙන ලදී.

නොවැම්බර් 27 ප.ව. 5.00: ශ්‍රී ලංකා කාලගුණ දෙපාර්තමේන්තුව විසින් නිල නිවේදනය නිකුත් කර, වෙරළබඩ ජනතාවට ආරක්ෂිත ස්ථාන වෙත යන ලෙස උපදෙස් ලබා දුන් අතර, දිවයිනේ ප්‍රදේශ රැසකට මිලිමීටර් 200 ඉක්මවූ වර්ෂාපතනයක් පිළිබඳ රතු නිවේදනයක් නිකුත් කරන ලදී.

නොවැම්බර් 27 ප.ව. 5.00–8.00: ප.ව. 5.00ට නිකුත් කළ අනතුරු ඇඟවීමේ පණිවිඩය ජනතාව වෙත ප්‍රමාණවත් ලෙස ළඟා වී ඇත්තේ රාත්‍රී 8.00 පමණ වන විට බව සාකච්ඡාවේදී සඳහන් විය.

නොවැම්බර් 27 ප.ව. 6.00: වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් තත්ත්වය පිළිබඳව අවධානයෙන් සිටින ලෙස දැනුම් දෙන ලදී.

නොවැම්බර් 27 ප.ව. 8.00: කොත්මලේ ජලාශය භාර අධ්‍යක්ෂවරයා විසින් වාන් දොරටු විවෘත කිරීමට නියමිත බව පොලීසියට දැනුම් දෙන ලදී.

නොවැම්බර් 27 ප.ව. 8.05: පළමු සයිරන් නාදය නිකුත් කරන ලදී.

නොවැම්බර් 27 ප.ව. 8.55: අවසන් සයිරන් නාදය නිකුත් කරන ලදී.

නොවැම්බර් 27 ප.ව. 9.00: වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජනතාවට හැකි ඉක්මනින් ආරක්ෂිත ස්ථාන වෙත ඉවත් වන ලෙස උපදෙස් ලබා දෙන ලදී.

නොවැම්බර් 27 ප.ව. 9.05–10.55: කොත්මලේ ජලාශයේ වාන් දොරටු එකවර නොව, ක්‍රමානුකූලව විවෘත කරන ලදී.

නොවැම්බර් 27 ප.ව. 9.05: මහවැලි ජලාශයේ වාන් දොරටුව විවෘත වූ බවත්, එම අවස්ථාවේදී සයිරන් අනතුරු ඇඟවීමක් සිදු නොවූ බවට චෝදනා ඉදිරිපත් වූ බවත් සාකච්ඡාවේදී සඳහන් විය. මෙම අවස්ථාව ආසන්නයේදී මරණ සිදුවූ බවද සඳහන් විය.

නොවැම්බර් 28 පෙ.ව.: ජලාශයේ ජල පරිමාව සනමීටර් 96ක් දක්වා ඉහළ ගොස් තිබූ බව සඳහන් විය. සාකච්ඡාවේදී තවදුරටත් සඳහන් වූයේ දින තුනක කාලයක් තුළ සමස්ත වර්ෂාපතනය මිලිමීටර් 1,500–2,000 අතර පරාසයක පැවති බවත්, තත්පරයට සනමීටර් 2,700ක පමණ ජල ප්‍රවාහයක් වාර්තා වූ බවත්ය.

<u>කොත්මලේ ජලාශය භාර අධ්‍යක්ෂවරයාගේ පැහැදිලි කිරීම</u>

කොත්මලේ ජලාශය භාර අධ්‍යක්ෂවරයා විසින් ජලාශය කෘෂිකාර්මික සහ පානීය ජල අවශ්‍යතා සඳහා අවශ්‍ය මට්ටමකින් පවත්වාගෙන යාම සාමාන්‍ය ක්‍රියාපටිපාටියක් බව පැහැදිලි කරන ලදී.

සයිරන් නාද කිරීම සම්බන්ධයෙන් අදහස් දක්වමින්, එය ජනතාව අතර "ජලාශයේ වේල්ල කැඩීමට ආසන්නය" වැනි වැරදි අවබෝධයක් ඇති කළ හැකි බැවින්, සයිරන් භාවිතය සම්බන්ධයෙන් සැලකිලිමත් වූ බව පැහැදිලි කරන ලදී.

තවද, ජලාශයේ ජල පෝෂක ප්‍රදේශය නුවරඑළිය සිට හෝර්ටන් තැන්න දක්වා පුළුල් ප්‍රදේශයක පැතිරී ඇති බැවින්, විශේෂයෙන් සවස් කාලයේදී සිදුවිය හැකි තද වර්ෂාපතනය නිවැරදිව පුරෝකථනය කිරීමේ දුෂ්කරතා පවතින බවද සඳහන් කරන ලදී. ජලාශයට අතිරේක ජල ප්‍රමාණයක් ලෙස සනමීටර් 200–300ක පමණ වර්ධනයක් දරාගැනීමේ හැකියාව පැවති බවද පැහැදිලි කරන ලදී.

<u>සාකච්ඡාවේදී හඳුනාගත් ප්‍රධාන ගැටලු</u>

- සිද්ධීන්ගේ කාලරාමුව, ඉදිරිපත් කළ සාක්ෂි සහ අදාළ ආයතනවල පැහැදිලි කිරීම් සලකා බැලීමේදී පහත සඳහන් ප්‍රධාන ගැටලු හඳුනාගත හැකි විය.

- කාලගුණ අනතුරු ඇඟවීම් සම්බන්ධීකරණය: ඉන්දියානු කාලගුණ බලධාරීන් ඇතුළු බාහිර මූලාශ්‍රවලින් ලැබුණු අනතුරු ඇඟවීම් සහ දේශීය තොරතුරු අතර ප්‍රතිචාර දැක්වීමේ සහ සම්බන්ධීකරණයේ ප්‍රමාදයන් පැවතීම.

- පෙර සූදානමේ අඩුපාඩු: අවශ්‍ය උපකරණ, ආරක්ෂිත ස්ථාන (shelters), ඉවත් කිරීමේ සැලසුම් සහ ජනතාව දැනුවත් කිරීමේ යාන්ත්‍රණ ප්‍රමාණවත් මට්ටමක නොතිබීම.

- ආයතන අතර සන්නිවේදන බිඳවැටීම: විදුලි තැපැල, දුරකථන සංඥා සහ විදුලිබලය වැනි සන්නිවේදන පහසුකම් අක්‍රිය වීම හේතුවෙන් තොරතුරු හුවමාරුවට බාධා සහ ප්‍රමාදයන් ඇතිවීම.

- ජනතාව වෙත අනතුරු ඇඟවීම් ළඟා වීමේ ප්‍රමාදය: මුල් අවස්ථාවේදී දැනුම්දීම් ප්‍රධාන වශයෙන් ධීවර ප්‍රජාව වෙත සීමා වී තිබීමත්, සාමාන්‍ය ජනතාව වෙත අනතුරු ඇඟවීම් ප්‍රමාණවත් වේගයකින් නොළඟාවීමත්.

- සම්පත් වෙන්කිරීමේ අසමානතාව: ආපදා කළමනාකරණයට අදාළ සම්පත් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කොළඹ කේන්ද්‍රීය ප්‍රවේශයක් පැවතීම සහ අවදානම් ප්‍රදේශවල අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සලකා නොබැලීම.

- ආයතනික වගකීම් පිළිබඳ අපැහැදිලිතාව: විවිධ රාජ්‍ය ආයතන අතර වගකීම් එකිනෙකා වෙත පැවරීමේ ප්‍රවණතාවක් පැවතීම හේතුවෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ වගවීම දුර්වල වීම.

- අයවැය හා සම්පත් සීමාවන්: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඇතුළු අදාළ ආයතනවලට අවශ්‍ය සම්පත් සහ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

- සයිරන් පද්ධති සම්බන්ධීකරණයේ දුර්වලතා: කොත්මලේ සහ මහවැලි ජලාශ ආශ්‍රිත සයිරන් පද්ධති ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය සම්බන්ධයෙන් අඩුපාඩු පැවතීම.

- කාලරාමු පිළිබඳ වාර්තාගත නොගැළපීම්: විවිධ ආයතන විසින් එකම සිදුවීම සම්බන්ධයෙන් අවසානයට වාර්තා කළ වේලාවන් සහ සිදුවීම් අනුපිළිවෙළ අතර අනනුකූලතා පැවතීම.

නෛතික විශ්ලේෂණය.

<u>මහජන භාර සිද්ධාන්තය **(Public Trust Doctrine)**</u>

Edith Brown Weiss විසින් **In Fairness to Future Generations (1989)** කෘතිය තුළ ඉදිරිපත් කරන අන්තර්පරම්පරා සමානාත්මතා **(intergenerational equity)** පිළිබඳ අදහස අනුව, වර්තමාන පරම්පරාව පෘථිවියේ ස්වාභාවික හා සංස්කෘතික සම්පත් තමන්ගේ පෞද්ගලික දේපළක් ලෙස නොසලකා, ඒවා අනාගත පරම්පරාවන් වෙනුවෙන් භාරකරුවෙකු **(trustee)** ලෙස ආරක්ෂා කළ යුතුය. සෑම පරම්පරාවක්ම පෙර පරම්පරාවෙන් ලැබුණු ස්වාභාවික හා සංස්කෘතික උරුමය භාරයක්

ලෙස ලබාගෙන, එය අනාගත පරම්පරාවට අවම වශයෙන් තමන්ට ලැබුණු තත්ත්වයෙන් නොඅඩු තත්ත්වයකින් පවරා දිය යුතු බව ඇය පෙන්වා දෙයි.[1]

මෙම මූලධර්මය අනුව, රජය සහ රාජ්‍ය ආයතන ස්වාභාවික සම්පත් හා පරිසරය සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී වර්තමාන ජනතාවගේ අවශ්‍යතා පමණක් නොව, අනාගත පරම්පරාවන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතාද සැලකිල්ලට ගත යුතුය. එබැවින් පරිසරය ආරක්ෂා කිරීම, ස්වාභාවික සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම සහ ඒවා අනාගත පරම්පරාවන් සඳහා සුරක්ෂිතව පවත්වාගෙන යාම රාජ්‍යයේ වැදගත් වගකීමක් ලෙස සැලකිය හැකිය.

<u>ශ්‍රී ලංකාවේ මහජන භාර සිද්ධාන්තය</u>

ශ්‍රී ලංකාවේ මහජන භාර සිද්ධාන්තයේ මූලික සංකල්පය පැහැදිලි කිරීමේදී, **C G Weeramantry** විනිසුරුවරයා විසින් ශ්‍රී ලංකාවේ පැරණි පාරිසරික සම්ප්‍රදාය පිළිබඳව ඉදිරිපත් කළ අදහස විශේෂ වැදගත්කමක් දරයි. ඔහු ***Gabčíkovo-Nagymaros Project (Hungary/Slovakia)*** නඩුවේ සිය වෙනම මතයේදී, දේවානම්පියතිස්ස රජු වෙත මිහිඳු මහරහතන් වහන්සේ විසින් කළ බවට සඳහන් වන උපදේශය උපුටා දක්වමින් මෙසේ සඳහන් කරයි:

"O great King, the birds of the air and the beasts have as equal a right to live and move about in any part of the land as thou. The land belongs to the people and all living beings; thou art only the guardian of it."[2]

මෙම අදහස සම්බන්ධයෙන් **C G Weeramantry** විනිසුරුවරයා විසින් පෙන්වා දෙන්නේ , එය නූතන පාරිසරික නීතියේ මූලික සංකල්පයක් වන **"The first principle of modern environmental law — the principle of trusteeship of earth resources"** ලෙස අවබෝධ කරගත හැකි බවයි.[3]

මෙහි මූලික නීතිමය අදහස වන්නේ භූමිය සහ ස්වාභාවික සම්පත් පාලකයාගේ පෞද්ගලික දේපළක් නොවන අතර, ඒවා ජනතාව සහ සියලු ජීවීන්ගේ ප්‍රයෝජනය සඳහා ආරක්ෂා කර පවත්වාගෙන යා යුතු පොදු සම්පත් බවයි. ඒ අනුව, රාජ්‍යය ස්වාභාවික සම්පත් සම්බන්ධයෙන් නිරපේක්ෂ

---

[1] Edith Brown Weiss, In Fairness to Future Generations: International Law, Common Patrimony, and Intergenerational Equity (United Nations University 1989).

[2] C G Weeramantry, Separate Opinion, Gabčíkovo-Nagymaros Project (Hungary/Slovakia) (Judgment) [1997] ICJ Rep 7, 102.

[3] ibid 101–102.

හිමිකරුවෙකු ලෙස නොව, වර්තමාන සහ අනාගත පරම්පරාවන් වෙනුවෙන් එම සම්පත් ආරක්ෂා කර කළමනාකරණය කරන භාරකරුවෙකු (trustee) ලෙස කටයුතු කළ යුතුය.

මෙම සංකල්පය ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ *Bulankulama and Others v Secretary, Ministry of Industrial Development and Others (Eppawala Case)* නඩුව සමඟද සම්බන්ධ කළ හැකිය. එම නඩුවේදී ස්වාභාවික සම්පත් සහ පරිසරය සම්බන්ධයෙන් රාජ්‍යයේ වගකීම, මහජන යහපත සහ අනාගත පරම්පරාවන්ගේ අවශ්‍යතා සම්බන්ධ මූලධර්ම වැදගත් කරුණු ලෙස සලකා බැලීය.[4]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම හා මූලික යුතුකම් සඳහන් 6 වන පරිච්ඡේදයෙහි, 27(14) ව්‍යවස්ථාව අනුව, පොදු මහජනතාව වෙනුවෙන් පරිසරය ආරක්ෂා කිරීම, වැඩිදියුණු කිරීම, වර්ධනය කිරීම රජයේ යුතුකමකි.

එසේ වුවද, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම වලට **(Directive Principles of State Policy)** නීතිමය වශයෙන් අධිකරණය මගින් බලාත්මක කළ නොහැකි බවට 29 වන ව්‍යවස්ථාවෙහි සඳහන් වීම තුළ මෙය හුදු ප්‍රතිපත්තිමය කාරණයක් විනා නෛතිකව බලාත්මක නොවන්නාවූ ප්‍රතිපාදනයකි.

එසේවුවද *රවීන්ද්‍ර කාරියවසම් එ. මධ්‍යම පරිසර අධිකාරිය සහ තවත් අය* නඩුවෙහි, ආණ්ඩුක්‍රමය අවස්ථාවෙහි රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම පරිච්ඡේදය අපතේ හරින් ලද තීන්ත ලෙස නොසැලකිය යුතු බවත්, පරිසර දූෂණය හෝ එවැනි හානියකට තුඩුදෙන හෝ එවැන්නකට අවසර ලබාදෙන ඕනෑම නීත්‍යානුකූල **නොවන අත්තනෝමතික විධායක හෝ පරිපාලන ක්‍රියාවකට හෝ නොකර හැරීමට ලක් නොවී සිටීමේ මූලික අයිතිවාසිකමක් පුරවැසියන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(14)ව්‍යවස්ථාව යටතේ පවතින බවට මෙහිදී ප්‍රකාශ විය .[5]**

පොදුවේ ගත් කළ පොදු භාර සිද්ධාන්තය රජයේ භාරකාරීත්වය සීමා කරන්නක් වන අතර මෙම සිද්ධාන්තය මගින් පහත කරුණු අවධාරණය කරයි.එනම්,

- පොදු දේපළ භුක්ති විඳීමට සෑම තැනැත්තකුටම අයිතියක් ඇති නමුත් පොදු දේපළ සීමා සහිත බැවින් ඒවාට යම් යම් සීමා පැනවිය හැකිය.

---

[4] Bulankulama and Others v Secretary, Ministry of Industrial Development and Others (Eppawala Case) SC (FR) Application No 884/99, (2000) 3 Sri LR 243.

[5] Ravindra Gunawardena Kariyawasam v Central Environmental Authority & Others, SCFR Application No 141/2015, Supreme Court of Sri Lanka, 4 April 2019.

- භාරකරුවකු විශ්වසනීය ලෙස කටයුතු කළ යුතුය.*Texas Eastern Tranamission Corporation* නඩුවෙහි, භාරකරු විශ්වසනීය භාරකරුවකු විය යුතු බවට අධිකරණය විසින් ප්‍රකාශ කරන ලදී.[6]

<u>**දිට්වා සුළිකුණාටුව සම්බන්ධයෙන් මහජන භාර සිද්ධාන්තය යෙදීම**</u>

දිට්වා සුළිකුණාටුව ස්වාභාවික සංසිද්ධියක් බැවින්, එය ඇතිවීම සම්බන්ධයෙන් රාජ්‍යයට සෘජු වගකීමක් පැවරීම Public Trust Doctrine මත පමණක් කළ නොහැකිය. එහෙත්, එම ආපදාවෙන් සිදුවූ හානියේ ප්‍රමාණය වැඩි කිරීමට හෝ අඩු කිරීමට බලපෑ හැකි රාජ්‍ය ප්‍රතිපත්ති, පාරිසරික කළමනාකරණය, ඉඩම් භාවිතය සහ ස්වාභාවික සම්පත් සම්බන්ධ තීරණ නීතිමය වශයෙන් විමර්ශනය කළ හැකිය.

ඒ අනුව, දිට්වා සුළිකුණාටුවට පෙර රාජ්‍යය විසින් තෙත්බිම්, ගංගා, ජල මාර්ග, වනාන්තර, වෙරළබඩ පරිසර පද්ධති සහ ස්වාභාවික ගංවතුර පාලන ප්‍රදේශ ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කර තිබේද යන්න විමසිය හැකිය. එමෙන්ම, ගංවතුර හා නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල සිදුකරන ලද සංවර්ධන කටයුතු, ඉඩම් භාවිත තීරණ සහ ඉදිකිරීම් සඳහා අවසර ලබාදීමේදී පාරිසරික හා ආපදා අවදානම් නිසි ලෙස සලකා තිබේද යන්නද විමර්ශනය කළ හැකිය.

යම් ස්වාභාවික සම්පතක් අනිසි ලෙස භාවිතා කිරීම, තෙත්බිම් විනාශ කිරීම, ජල මාර්ග අවහිර කිරීම හෝ අවදානම් සහිත ප්‍රදේශවල ප්‍රමාණවත් පාරිසරික සැලසුම් නොමැතිව සංවර්ධන කටයුතු සිදු කිරීම

හේතුවෙන් ආපදා අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී තිබේ නම්, එවැනි රාජ්‍ය තීරණ මහජන භාර සිද්ධාන්තය යටතේ විවේචනාත්මකව විමර්ශනය කළ හැකිය.

මෙහිදී Public Trust Doctrine සහ අන්තර්පරම්පරා සමානාත්මතාව යන සංකල්ප දෙක එකිනෙකට සම්බන්ධ වේ. එනම්, රාජ්‍යය වර්තමාන ජනතාවගේ ආරක්ෂාව පමණක් නොව, අනාගත පරම්පරාවන්ට ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් භාරදීමේ වගකීමක්ද දරයි. එබැවින් දිට්වා වැනි ආපදා සම්බන්ධයෙන් රාජ්‍යයේ නීතිමය වගකීම විමසීමේදී, ආපදාවට පසු ලබාදෙන සහන පමණක් නොව, ආපදාවට පෙර සිදුකළ පාරිසරික හා සංවර්ධන තීරණද සලකා බැලීම අවශ්‍ය වේ.

ඒ අනුව, C G Weeramantry විනිසුරුවරයා විසින් ඉදිරිපත් කරන ලද "trusteeship of earth resources" යන සංකල්පය සහ Edith Brown Weiss විසින් වර්ධනය කරන ලද intergenerational

---

6 In re Texas Eastern Transmission Corp PCB Contamination Insurance Coverage Litigation 15 F 3d 1230 (3d Cir 1994).

equity යන මූලධර්මය දිව්වා සුළිකුණාටුව පිළිබඳ නීතිමය විශ්ලේෂණයට යොදාගැනීමෙන්, පරිසර ආරක්ෂාව, රාජ්‍ය වගවීම, ආපදා අවදානම් අවම කිරීම, ජනතාවගේ ජීවිත හා දේපළ ආරක්ෂාව සහ අනාගත පරම්පරාවන්ගේ අයිතිවාසිකම් යන සියලු කරුණු එකිනෙකට සම්බන්ධ කර විශ්ලේෂණය කළ හැකිය.

<u>ජීවිතයට ඇති අයිතිය සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයකට ඇති අයිතිය (Right to Life & Right to a Healthy Environment)</u>

දිව්වා සුළිකුණාටුව සම්බන්ධ මානව හිමිකම් විශ්ලේෂණයේදී ජීවිතයට ඇති අයිතිය (**Right to Life**) මූලික කරුණක් ලෙස සැලකිය හැකිය. ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන වගන්තිය මඟින් පුද්ගලයෙකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස ආරක්ෂා කරන අතර, ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය එම අයිතිය පුළුල් ලෙස අර්ථකථනය කර ඇත.[7] විශේෂයෙන්ම ***Vellore Citizens Welfare Forum v Union of India*** නඩුවේදී, පරිසර ආරක්ෂාව ජීවිතයට ඇති අයිතියේ වැදගත් අංගයක් ලෙස සලකා, පුද්ගලයන්ට පිරිසිදු වාතය, පිරිසිදු ජලය සහ දූෂණයෙන් තොර පරිසරයක් භුක්ති විඳීමට ඇති අයිතිය ජීවිතයට ඇති අයිතිය සමඟ සම්බන්ධ කර ඇත. [8]

එම නඩුවේදී ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය පරිසර ආරක්ෂණය Article 21 යටතේ ඇති ජීවිතයේ අයිතියේ කොටසක් බවට අවධාරණය කළ අතර, **precautionary principle** සහ **polluter pays principle** ද ඉන්දියානු පාරිසරික නීතියේ කොටස් ලෙස පිළිගත්තේය. එමඟින් ජීවිතයට ඇති අයිතිය යනු හුදෙක් ජීවත්ව සිටීමේ අයිතියක් පමණක් නොව, මිනිස් ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය පාරිසරික තත්ත්වයන් ආරක්ෂා කිරීම සමඟද සම්බන්ධ අයිතියක් බව පැහැදිලි වේ.[9]

ශ්‍රී ලංකාවේ ජීවිතයට ඇති අයිතිය පිළිබඳ ව්‍යවස්ථාමය ප්‍රවේශය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන වගන්තියට සමානව "Right to Life" යනුවෙන් පැහැදිලිව නම් කර ඇති මූලික අයිතිවාසිකමක් නොමැති වුවද, ශ්‍රී ලංකා අධිකරණය මූලික අයිතිවාසිකම් පිළිබඳ ව්‍යවස්ථාමය විධිවිධාන පුළුල් ලෙස අර්ථකථනය කිරීම හරහා ජීවිතයට හා පුද්ගල ආරක්ෂාවට අදාළ ආරක්ෂාවන් හඳුනාගෙන ඇත.

විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය මඟින් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමෙන් ආරක්ෂාව ලබාදෙන අතර, 13(4) වගන්තිය මඟින් නීතියට අනුව මිය

[7] Constitution of India 1950, art 21.
[8] Vellore Citizens' Welfare Forum v Union of India (1996) 5 SCC 647, 657–658.
[9] Vellore Citizens' Welfare Forum v Union of India (1996) 5 SCC 647, 657–658.

පුද්ගලයෙකුගේ ජීවිතය අහිමි නොකළ යුතු බව තහවුරු කරයි. මේවා එකට සලකා බැලීමේදී, පුද්ගල ජීවිතයේ අගය සහ එය රාජ්‍ය බලයෙන් ආරක්ෂා කිරීමේ ව්‍යවස්ථාමය වගකීම හඳුනාගත හැකිය.

Sriyani Silva v Chanaka Iddamalgoda **නඩුවේදී, ශ්‍රී ලංකා අධිකරණය ජීවත් වීමට ඇති අයිතිය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 13(4) වගන්ති සමඟ සම්බන්ධ කරමින් විග්‍රහ කිරීමෙන්, ශ්‍රී ලංකා නීතිය තුළ ජීවත් වීමට ඇති අයිතිය ව්‍යංගාර්ථවත් implied right to life වන බවට අර්ථ නිරූපණය කර ඇත.** [10]

එබැවින්, ශ්‍රී ලංකාවේ ජීවිතයට ඇති අයිතිය ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ Article 21 වැනි වගන්තියකින් සෘජුව ප්‍රකාශ නොවුවත්, ව්‍යවස්ථාවේ පවතින මූලික අයිතිවාසිකම් එකට කියවීමෙන් පුද්ගල ජීවිතය සහ එහි අත්‍යවශ්‍ය කොන්දේසි ආරක්ෂා කිරීමේ ව්‍යවස්ථාමය පදනමක් ගොඩනැගිය හැකිය.

<u>සෞඛ්‍යසම්පන්න පරිසරයකට ඇති අයිතිය සහ දිට්වා ආපදාව.</u>

මෙම මූලධර්මය දිට්වා සුළිකුණාටුවේදී විශේෂයෙන් වැදගත් වේ. මන්ද, ජීවිතයට ඇති අයිතිය ආරක්ෂා කිරීම යනු ආපදාව සිදුවන මොහොතේදී පුද්ගලයෙකු බේරා ගැනීම පමණක් නොව, ජීවිතයට තර්ජනයක් වන පාරිසරික හා ආපදා අවදානම් හැකිතාක් පෙර හඳුනාගෙන ඒවා අවම කිරීමට රාජ්‍යය ක්‍රියා කිරීමද ඇතුළත් බව තර්ක කළ හැකි බැවිනි.

ඒ අනුව, දිට්වා සුළිකුණාටුවට පෙර ගංවතුර අවදානම් ප්‍රදේශ, තෙත්බිම්, ගංගා සහ ජල මාර්ග, වනාන්තර සහ වෙරළබඩ පරිසර පද්ධති නිසි ලෙස ආරක්ෂා කර තිබේද, ස්වාභාවික ජල ගලායාමට බාධා වන සංවර්ධන කටයුතු පාලනය කර තිබේද, අවදානම් පිළිබඳ ප්‍රමාණවත් පූර්ව අනතුරු ඇඟවීම් ලබාදී තිබේද සහ ජනතාව ආරක්ෂිත ස්ථාන වෙත කාලෝචිතව ඉවත් කර තිබේද යන්න විමසිය යුතුය.

එමෙන්ම, දිට්වා ආපදාවෙන් පසුව පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂාව, ආහාර, වෛද්‍ය පහසුකම් සහ ආරක්ෂිත නවාතැන් ලබාදීමද ජීවිතය සහ සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ රාජ්‍ය වගකීමේ කොටසක් ලෙස සලකා බැලිය හැකිය. *Vellore Citizens Welfare Forum v Union of India* නඩුවේදී පිරිසිදු වාතය, පිරිසිදු ජලය සහ **pollution-free Environment** ජීවිතයට ඇති අයිතිය සමඟ සම්බන්ධ කර ඇති බැවින්, ආපදාවකින් පසු පානීය ජලය දූෂණය වීම හෝ පරිසරය සෞඛ්‍යයට තර්ජනයක් වන තත්ත්වයක පැවතීමද මානව හිමිකම් ප්‍රවේශයකින් විමසිය හැකිය. [11]

<u>දිට්වා වින්දිතයන්ගේ මානව හිමිකම් සහ රාජ්‍ය වගකීම.</u>

---

[10] Kottabadu Durage Sriyani Silva v Chanaka Iddamalgoda (2003) 2 Sri LR 63.
[11] Vellore Citizens' Welfare Forum v Union of India (1996) 5 SCC 647, 657–658.

ඒ අනුව, දිට්වා සුළිකුණාටුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ජීවිත හා සෞඛ්‍යයට සිදුවූ හානි විමසීමේදී, "මෙය ස්වාභාවික ආපදාවක් බැවින් රාජ්‍යයට කිසිදු වගකීමක් නොමැත" යන තර්කය පමණක් ප්‍රමාණවත් නොවේ. ඒ වෙනුවට, රාජ්‍යය විසින් දැන සිටි හෝ සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි ආපදා අවදානම් අවම කිරීමට, ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමට සහ ආපදාවෙන් පසුව මූලික මානව අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් හා සාධාරණ පියවර ගත්තේද යන්න පරීක්ෂා කළ යුතුය.

මෙහිදී ***Vellore Citizens' Welfare Forum v Union of India*** නඩුවෙන් වර්ධනය වූ ජීවිතයට ඇති අයිතිය සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයකට ඇති අයිතිය අතර සම්බන්ධතාවය, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 සහ 13(4) වගන්ති මත වර්ධනය වන ව්‍යංගාර්ථවත් ජීවිත අයිතිය (Implied right to life) සමඟ සම්බන්ධ කර සලකා බැලිය හැකිය. ***Sriyani Silva v Chanaka Iddamalgoda*** නඩුවද මේ සම්බන්ධයෙන් වැදගත් වේ.[12] කෙසේ වෙතත්, දිට්වා ආපදාවෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ මානව හිමිකම් විශ්ලේෂණය කිරීමේදී, ජීවිත් වීමේ අයිතියට පමණක් සීමා නොවිය යුතුය. ආපදාවකදී ජීවිතය ආරක්ෂා කිරීමෙන් පසු පුද්ගලයන්ට ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය අනෙකුත් ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්ද ආරක්ෂා කිරීම රාජ්‍යයේ වගකීමක් ලෙස සලකා බැලිය යුතුය.

<u>**සෞඛ්‍යයට ඇති අයිතිය. (Right to Health)**</u>

දිට්වා වැනි ආපදාවකින් පසුව ගංවතුර, පානීය ජලය දූෂණය වීම, සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම, රෝග පැතිරීම සහ වෛද්‍ය පහසුකම් අඩාල වීම වැනි තත්ත්වයන් ඇති විය හැකිය. එබැවින් බලපෑමට ලක් වූ වින්දිත ජනතාවට හදිසි වෛද්‍ය ප්‍රතිකාර, ඖෂධ, පිරිසිදු ජලය, සනීපාරක්ෂක පහසුකම් සහ මානසික සෞඛ්‍ය සහාය ලබාදීම පිළිබඳ රාජ්‍යය පියවර ගනු ලැබිය යුතුය.

ජාත්‍යන්තර නීතිය යටතේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය **(International Covenant on Economic, Social and Cultural Rights – ICESCR)** හි 12 වන වගන්තිය මගින් සෑම පුද්ගලයෙකුටම හැකි ඉහළම ශාරීරික හා මානසික සෞඛ්‍ය මට්ටම භුක්ති විඳීමේ අයිතිය පිළිගෙන ඇත. ශ්‍රී ලංකාව මෙම සම්මුතියේ රාජ්‍ය පාර්ශ්වකරුවෙකු **(State Party)** බැවින්, එහි පිළිගත් අයිතිවාසිකම් ගරු කිරීම, ආරක්ෂා කිරීම සහ ක්‍රමානුකූලව සාක්ෂාත් කිරීම සඳහා රාජ්‍යයට ජාත්‍යන්තර නීතිමය වගකීම් පවතී.[13]

---

[12] Kottabadu Durage Sriyani Silva v Chanaka Iddamalgoda (2003) 2 Sri LR 63; Constitution of the Democratic Socialist Republic of Sri Lanka 1978, arts 11 and 13(4).

[13] International Covenant on Economic, Social and Cultural Rights (adopted 16 December 1966, entered into force 3 January 1976) 993 UNTS 3, arts 2(1) and 12.

ඒ අනුව, දිට්වා සුළිකුණාටුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ට හදිසි වෛද්‍ය ප්‍රතිකාර, ඖෂධ, පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම් සහ අනෙකුත් අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා ප්‍රමාණවත් හා සමාන ප්‍රවේශයක් ලබාදීම හුදෙක් ආපදා සහන කාර්යයක් ලෙස පමණක් නොව, ශ්‍රී ලංකාව ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය(ICESCR) හි රාජ්‍ය පාර්ශවකරුවෙකු වීම හේතුවෙන් පැන නගින ජාත්‍යන්තර මානව හිමිකම් ආරක්ෂණ වගකීමක් ලෙසද සැලකිය යුතුය.

තවද, ස්වාභාවික ආපදාවක් සිදුවීම පමණින් රාජ්‍යයේ වගකීම ස්වයංක්‍රීයව අවසන් නොවේ. විශේෂයෙන්ම, ආපදා අවස්ථාවකදී අවදානමට ලක්වූ ජනතාවට අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා ලබාදීමට රාජ්‍යය විසින් සාධාරණ ලෙස අපේක්ෂිත පියවර ගත්තේද, එම සේවා සියලු බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට සමානව හා ප්‍රවේශ විය හැකි ලෙස ලබාදුන්නේද යන්න පරීක්ෂා කළ යුතුය. එවැනි වගකීම් ඉටු කිරීමට රාජ්‍යයක් ලෙස අපොහොසත් වී ඇති බව කරුණු මගින් තහවුරු වන්නේ නම්, එය රාජ්‍ය වගකීම **(State responsibility)** පිළිබඳ ජාත්‍යන්තර නීතිමය වගකීම උල්ලංඝනයක් ලෙස සැළකිය හැකිය.

<u>අධ්‍යාපනයට ඇති අයිතිය **(Right to Education)**</u>

ආපදාවකින් පසුව පාසල් ගොඩනැගිලි විනාශ වීම, පාසල් තාවකාලික නවාතැන් ලෙස භාවිතා කිරීම, පාසල් ගමනාගමනය බාධා වීම සහ පවුල් අවතැන් වීම හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපනය අඩාල විය හැකිය.

ඒ අනුව, දිට්වා හේතුවෙන් වින්දිත දරුවන්ට අධ්‍යාපනය අඛණ්ඩව ලබාගැනීමට අවශ්‍ය පහසුකම් නැවත ස්ථාපිත කිරීමට රාජ්‍යය කටයුතු කළේද යන්න විමසිය යුතුය. මෙහිදී ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය(**ICESCR Article 13**) සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය **(Convention on the Rights of the Child – CRC) Articles 28** සහ **29** මගින් දරුවන්ගේ අධ්‍යාපන අයිතියට ලබාදී ඇති ජාත්‍යන්තර ආරක්ෂාව වැදගත් වේ.[14]

විශේෂයෙන්ම **Convention on the Rights of the Child – CRC) Articles 28** මගින් දරුවාට අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය පිළිගෙන ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය හා නොමිලේ ලබාදීම සහ ද්විතීයික අධ්‍යාපනයට ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යයන් විසින් සුදුසු පියවර ගැනීම

---

[14] Convention on the Rights of the Child (adopted 20 November 1989, entered into force 2 September 1990) 1577 UNTS 3, arts 28–29.

අවධාරණය කරයිඑසේම. **CRC Article 29** මගින් අධ්‍යාපනයේ අරමුණු ලෙස දරුවාගේ පෞරුෂය දක්ෂතා සහ මානසික ශාරීරික හැකියාවන් උපරිම ලෙස වර්ධනය කිරීම හඳුනා ගනියි.

විශේෂයෙන්ම, ආපදාවෙන් පසුව දිගුකාලීනව පාසල් අධ්‍යාපනයෙන් ඉවත් වන දරුවන්ගේ අධ්‍යාපන අයිතිය, ජීවනෝපාය සහ අනාගත අවස්ථා කෙරෙහි ඇති බලපෑමද සලකා බැලිය යුතුය.

<u>කාන්තාවන්ගේ අයිතිවාසිකම් (**Women's Rights**)</u>

දිට්වා සුළිකුණාටුව වැනි ස්වාභාවික ආපදාවකදී කාන්තාවන් සහ ගැහැණු ළමුන් විශේෂ අවදානම්වලට මුහුණ දිය හැකි බැවින්, කාන්තාවන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම ආපදා කළමනාකරණයේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස සලකා බැලිය යුතුය. මෙහිදී ආරක්ෂිත නවාතැන්,

පිරිසිදු ජලය හා සනීපාරක්ෂක පහසුකම්, සෞඛ්‍ය සේවා, ප්‍රජනන සෞඛ්‍ය සේවා සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂ හිංසනයෙන් ආරක්ෂාව ලබාදීම විශේෂයෙන් වැදගත් වේ.

ජාත්‍යන්තර නීතිය යටතේ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් ඉවත් කිරීම පිළිබඳ සම්මුතිය (**Convention on the Elimination of All Forms of Discrimination against Women – CEDAW**) කාන්තාවන්ට වෙනස්කම් නොකරීමට සහ සමාන ආරක්ෂාවක් ලබාදීම සඳහා පාර්ශවකාර රාජ්‍යයන්ට වගකීම් පවරයි.[15] විශේෂයෙන් **CEDAW 12** වන වගන්තිය මගින් කාන්තාවන්ට සෞඛ්‍ය සේවා සඳහා සමාන ප්‍රවේශය තහවුරු කරන අතර, **14(2)** වගන්තිය මගින් ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන්ගේ විශේෂ අවශ්‍යතා සහ මූලික සේවා සඳහා ඔවුන්ගේ ප්‍රවේශය පිළිබඳ අවධානය යොමු කරයි.[16]

ශ්‍රී ලංකාව **CEDAW** හි රාජ්‍ය පාර්ශ්වකරුවෙකු (**State Party**) වන බැවින්, දිට්වා ආපදාවෙන් බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර නීතිමය වගකීම් පවතී. ඒ අනුව, ආපදා සහන හා ප්‍රතිසාධන ක්‍රියාමාර්ග සැලසුම් කිරීමේදී කාන්තාවන්ගේ විශේෂ අවශ්‍යතා නොසලකා හැරීම හෝ ඔවුන්ට සහන හා සෞඛ්‍ය සේවා සඳහා සමාන ප්‍රවේශයක් ලබා නොදීම වෙනස්කම් නොකිරීමේ සහ සමානත්වයේ මූලධර්ම සම්බන්ධ ගැටලුවක් බවට පත්විය හැකිය.

විශේෂයෙන්ම අවතැන් කඳවුරු හෝ තාවකාලික නවාතැන්වලදී කාන්තාවන්ට ප්‍රමාණවත් පෞද්ගලිකත්වයක්, ආරක්ෂිත සනීපාරක්ෂක පහසුකම් සහ හිංසනයෙන් ආරක්ෂාව නොලැබීමේ

[15] Convention on the Elimination of All Forms of Discrimination against Women (adopted 18 December 1979, entered into force 3 September 1981) 1249 UNTS 13 (CEDAW) arts 1–2.

[16] CEDAW (n 2) art 12(1) and art 14(2)(b), (h).

තත්ත්වයක් ඇතිවන්නේ නම්, එය කාන්තාවන්ගේ ගෞරවය, සෞඛ්‍යය සහ පුද්ගලික ආරක්ෂාව සම්බන්ධ මානව හිමිකම් ගැටලුවක් ලෙස විමසිය හැකිය.

තවද, **CEDAW 14** වන වගන්තිය දිවිවා වැනි ආපදාවලදී විශේෂයෙන් වැදගත් වන්නේ, ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන කාන්තාවන් බොහෝවිට ස්වාභාවික සම්පත් සහ ජීවනෝපාය මත වැඩි වශයෙන් රඳා පවතින බැවිනි.[17] ආපදාව හේතුවෙන් කෘෂිකර්මාන්තය, ධීවර කටයුතු හෝ සුළු ව්‍යාපාර වැනි ජීවනෝපායන් අහිමි වූ විට, කාන්තාවන්ගේ ආර්ථික අයිතිවාසිකම් සහ ජීවනෝපාය නැවත ස්ථාපිත කිරීමද රාජ්‍යයේ ප්‍රතිසාධන සැලසුම්වල කොටසක් විය යුතුය.[18]

<u>ළමුන්ගේ අයිතිවාසිකම්</u>

ළමුන් ආපදා අවස්ථාවලදී විශේෂ ආරක්ෂාවක් අවශ්‍ය වන කණ්ඩායමකි. දිවිවා සුළිකුණාටුව හේතුවෙන් නිවාස අහිමි වීම, දෙමාපියන්ගෙන් වෙන්වීම, අධ්‍යාපනය අඩාල වීම, පෝෂණ ගැටලු සහ සෞඛ්‍ය අවදානම් වැනි තත්ත්වයන්ට ළමුන් මුහුණ දිය හැකිය.

මෙහිදී ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය **(Convention on the Rights of the Child – CRC)** යටතේ පිළිගෙන ඇති මූලධර්ම දිවිවා ආපදාවට අදාළව විශේෂ වැදගත්කමක් දරයි. ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියෙහි රාජ්‍ය පාර්ශ්වකරුවෙකු (State Party) වන බැවින්, ආපදා අවස්ථාවලදී ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර නීතිමය වගකීම් ශ්‍රී ලංකා රාජ්‍යයට පවතී.[19]

විශේෂයෙන්ම, ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියෙහි (**CRC**) **3** වන වගන්තියේ අන්තර්ගත "දරුවාගේ යහපත ප්‍රමුඛ කරුණක් විය යුතුය" **(best interests of the child)** යන මූලධර්මය අනුව, දිවිවා සම්බන්ධ සෑම ආපදා කළමනාකරණය, ඉවත් කිරීම, සහන සහ ප්‍රතිසාධන ක්‍රියාමාර්ගයකදීම දරුවන්ගේ යහපත ප්‍රමුඛ වශයෙන් සලකා බැලිය යුතුය.[20]

තවද, ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියෙහි **(CRC) 6** වන වගන්තිය මගින් සෑම දරුවෙකුගේම ජීවිතයට ඇති අයිතිය පිළිගෙන, දරුවාගේ පැවැත්ම සහ සංවර්ධනය හැකිතාක් උපරිමයෙන් සහතික කිරීමේ වගකීම රාජ්‍යයට පවරයි.[21] **24** වන වගන්තිය මගින් දරුවන්ට හැකි ඉහළම සෞඛ්‍ය මට්ටම

---

[17] CEDAW (n 2) art 14(2); Committee on the Elimination of Discrimination against Women, 'General Recommendation No 34 on the Rights of Rural Women' (2016) UN Doc CEDAW/C/GC/34, paras 5–10.

[18] CEDAW (n 2) art 14(2)(a), (c), (e) and (g); Committee on the Elimination of Discrimination against Women, 'General Recommendation No 34' (n 7) paras 54–63.

[19] Convention on the Rights of the Child (adopted 20 November 1989, entered into force 2 September 1990) 1577 UNTS 3.

[20] ibid art 3.

[21] ibid art 6.

භුක්ති විඳීමේ අයිතිය පිළිගන්නා අතර, ආපදාවෙන් පසු පිරිසිදු ජලය, පෝෂණය, සනීපාරක්ෂාව සහ වෛද්‍ය සේවා සඳහා දරුවන්ට ප්‍රවේශය ලබාදීමේ වැදගත්කම එමඟින් පැහැදිලි වේ.[22] එමෙන්ම, 28 වන වගන්තිය මගින් දරුවාගේ අධ්‍යාපනයට ඇති අයිතිය පිළිගන්නා බැවින්, දිට්වා හේතුවෙන් පාසල් අධ්‍යාපනය අඩාල වූ දරුවන්ට අධ්‍යාපනය නැවත අඛණ්ඩව ලබාගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීමද රාජ්‍යයේ වගකීමක් ලෙස සලකා බැලිය හැකිය.[23]

ඒ අනුව, දිට්වා ආපදාව සම්බන්ධයෙන් නීතිමය වශයෙන් විමසිය හැක්කේ, ළමුන්ගේ ජීවිතය, සෞඛ්‍යය, පෝෂණය, ආරක්ෂාව සහ අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍යය ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය (**CRC**)යටතේ තම ජාත්‍යන්තර වගකීම් ප්‍රමාණවත් ලෙස ඉටු කළේද

යන්නයි. විශේෂයෙන්ම ආපදා සහන හා ප්‍රතිසාධන ක්‍රියාමාර්ගවලදී දරුවන්ගේ විශේෂ අවශ්‍යතා **නොසලකා හැරීමක් සිදුවී ඇත්නම් , එය ළමා අයිතිවාසිකම් පිලිබඳ ජත්‍යන්තර නීතිමය වගකීම් උල්ලංඝනය වේ.**

<u>දිට්වා සුළි කුණාටුව සහ ආබාධිත ප්‍රජාවේ අයිතිවාසිකම්: සමානාත්මතාවය, ප්‍රවේශය සහ ආපදා ආරක්ෂාව</u>

දිට්වා සුළි කුණාටුව වැනි ස්වාභාවික ආපදා තත්ත්වයකදී ආබාධිත පුද්ගලයන් විශේෂ අවදානමකට ලක්විය හැකිය. ආපදා අනතුරු ඇඟවීම් වෙත ප්‍රවේශ වීම, ආරක්ෂිත ස්ථාන වෙත ඉවත් කිරීම, නවාතැන් පහසුකම් භාවිත කිරීම, ආහාර හා ඖෂධ ලබාගැනීම සහ හදිසි සෞඛ්‍ය සේවා ලබාගැනීම යන අවස්ථාවලදී ඔවුන්ට අමතර බාධක ඇති විය හැකිය. එබැවින්, දිට්වා සුළි කුණාටුව සම්බන්ධ ආපදා ප්‍රතිචාරය සලකා බැලීමේදී ආබාධිත ප්‍රජාවේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් සමානාත්මතාවය, වෙනස්කම් නොකිරීම, ප්‍රවේශය, ආරක්ෂාව සහ සහභාගීත්වය යන මූලධර්ම විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **Article 12(1)** මඟින් නීතිය ඉදිරියේ සමානාත්මතාවය සහ සමාන නීතිමය ආරක්ෂාව තහවුරු කරන අතර, **Article 12(2)** මඟින් නිශ්චිත පදනම් මත වෙනස්කම් කිරීම තහනම් කරයි.[24] එහෙත් සමානාත්මතාවය යනු සියලු පුද්ගලයන්ට සෑම අවස්ථාවකදීම එකම ආකාරයෙන් සැලකීම පමණක් නොවේ. ආබාධිත පුද්ගලයන්ට පවතින විශේෂ බාධක හඳුනාගෙන

---

[22] ibid art 24.

[23] ibid art 28.

[24] Sri Lanka, Constitution of the Democratic Socialist Republic of Sri Lanka (1978), arts 12(1)–(2).

ඒවාට ප්‍රතිචාර දැක්වීම හරයාත්මක සමානාත්මතාවය (**substantive equality**) තහවුරු කිරීම සඳහා අවශ්‍ය වේ.

මෙම අදහස **Convention on the Rights of Persons with Disabilities (CRPD)** හි **Article 5(4)** සමඟ සෘජුව සම්බන්ධ කළ හැකිය. එම වගන්තිය අනුව ආබාධිත පුද්ගලයන් සමානාත්මතාවය සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය විශේෂ පියවර ගැනීම වෙනස් කොට සැලකීමක් (**discrimination**) ලෙස නොසැලකේ.[25] එබැවින් දිට්වා සුළි කුණාටුවකදී රෝද පුටු (**wheelchair**) භාවිතා කරන පුද්ගලයන් සඳහා ප්‍රවේශ විය හැකි නවාතැන්, ශ්‍රවණ ආබාධ සහිත පුද්ගලයන් සඳහා සංඥා භාෂා සහිත අනතුරු ඇඟවීම්, **text alerts** සහ උපසිරැසි (**subtitles**), දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා ශ්‍රව්‍ය අනතුරු ඇඟවීම් සහ විශේෂ ආරක්ෂිතව ඉවත් කිරීමේ පහසුකම් (**evacuation**) ලබාදීම **Article 12(2)** හි සමානාත්මතා මූලධර්මයට පටහැනි නොවේ. ඒ වෙනුවට, එවැනි විශේෂ පියවර සමානාත්මතාවය ප්‍රායෝගිකව සාක්ෂාත් කිරීමේ මාධ්‍යයක් වේ.[26]

- තොරතුරු ලබාගැනීමේ අයිතිය

ආපදා අවස්ථාවකදී නිවැරදි සහ කාලෝචිත තොරතුරු ලබාගැනීම ජීවිත ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය වේ. එබැවින් දිට්වා සුළි කුණාටුව සම්බන්ධ අනතුරු ඇඟවීම්, විශේෂ ආරක්ෂිතව ඉවත් කිරීමේ නියෝග (**evacuation orders**), ආරක්ෂිත ස්ථාන සහ සහන සේවා පිළිබඳ තොරතුරු විවිධ ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි ආකාරයෙන් ලබාදිය යුතුය. මෙය ආබාධිත පුද්ගලයන්ට සමාන තොරතුරු ප්‍රවේශයක් ලබාදීමේ වගකීමක් ලෙස සලකා බැලිය හැකිය.

- ආරක්ෂිතව ඉවත් කිරීමේ අයිතිය

ආපදා කළමනාකරණ සැලසුම්වලදී ආබාධිත පුද්ගලයන්ගේ විශේෂ අවශ්‍යතා ඇතුළත් නොකළහොත්, "සමාන" ආරක්ෂිතව ඉවත් කිරීමේ සැලැස්මක් (**evacuation plan**)එකක් තුළ පවා ඔවුන්ට සැබෑ ලෙස සමාන ආරක්ෂාවක් සුරක්ෂිත කළ නොහැකිය. රෝද පුටු (**wheelchair**) භාවිතා කරන පුද්ගලයන්, සංචලන අපහසුතා (**mobility difficulties**)ඇති පුද්ගලයන්, දෘශ්‍යාබාධිත සහ ශ්‍රවණ ආබාධිත පුද්ගලයන් සඳහා එකිනෙකට වෙනස් ආකාරයේ සහාය අවශ්‍ය විය හැකිය.

මෙහිදී **Convention on the Rights of Persons with Disabilities CRPD Article 11** විශේෂ වැදගත්කමක් ගනී. එය ස්වාභාවික ආපදා සහ අනෙකුත් මානුෂීය හදිසි අවස්ථාවලදී ආබාධිත

---

[25] Convention on the Rights of Persons with Disabilities (adopted 13 December 2006, entered into force 3 May 2008) 2515 UNTS 3, art 5(4).

[26] ibid art 11.

පුද්ගලයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම රාජ්‍යයේ වගකීමක් ලෙස පිළිගනී.[27] එබැවින් දිට්වා සුළි කුණාටුවේදී ආබාධිත පුද්ගලයන් සඳහා විශේෂ ආරක්ෂිතව ඉවත් කිරීමේ **යාන්ත්‍රණයක්** (evacuation mechanisms)තිබීම, මානව හිමිකම් මත පදනම් වූ රාජ්‍ය වගකීමක් ලෙසද සැලකිය හැකිය.

➢ නවාතැන් සහ මූලික සේවාවන් සඳහා ප්‍රවේශය

ආපදා නවාතැන් ස්ථානවල රෝද පුටු **(wheelchair access)**, සංචලන අපහසුතා **(accessible toilets)**, පානීය ජලය **(drinking water)**, ආහාර **(food)**,ඖෂධ **(medication)** සහ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සහතික කළ යුතුය. එවැනි පහසුකම් නොමැති වීම ආබාධිත පුද්ගලයන්ට අනෙක් පුද්ගලයන්ට වඩා දැඩි බලපෑමක් ඇති කළ හැකිය. එබැවින් "සියලු දෙනාට එකම නවාතැන් පහසුකම" ලබාදීම වෙනුවට, අවශ්‍යතාවයට අනුව(**reasonable accommodation**) ලබාදීම සමානාත්මතාවයේ වඩාත් සාධාරණ ප්‍රවේශය වේ.

➢ ගෞරවය, වෙනස්කම් නොකිරීම සහ මානව හිමිකම්

ආපදා තත්ත්වයක් ඇති වූ විට ආබාධිත පුද්ගලයන් "අනුකම්පාව අවශ්‍ය පුද්ගලයන්" ලෙස පමණක් නොව, සමාන ගෞරවය සහ අයිතිවාසිකම් හිමි පුද්ගලයන් ලෙස සැලකිය යුතුය. Article 12(2) හි සමානාත්මතාවයේ මූලධර්මය සහ Convention on the Rights of Persons with Disabilities **(CRPD**)හි සමානාත්මතාවය පිළිබඳ ප්‍රවේශය එකට සලකා බැලීමෙන්, ආපදා සහන ලබාදීමේදී ආබාධිත පුද්ගලයන් පසෙකට දැමීම හෝ ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා නොසලකා හැරීම සමානාත්මතාවයේ අරමුණට පටහැනි විය **හැකිය.**[12]

➢ තීරණ ගැනීමේදී සහභාගීත්වය

ආබාධිත ප්‍රජාව සම්බන්ධ ආපදා ප්‍රතිචාර සැලසුම් ඔවුන්ගේ අදහස් නොමැතිව සකස් කිරීමෙන් සැබෑ අවශ්‍යතා මගහැරිය හැකිය. එබැවින් ආපදා කළමනාකරණ සැලසුම්, ආරක්ෂිතව ඉවත් කිරීමේ ක්‍රියාවලිය **(evacuation procedures)** සහ ආපදා සහන සැලසීමේ ක්‍රියාවලිය **(relief mechanisms)** සකස් කිරීමේදී ආබාධිත පුද්ගලයන් සහ ඔවුන් නියෝජනය කරන සංවිධාන සහභාගී කරගැනීම වැදගත් වේ. මෙය **"Nothing about us without us"** යන ආබාධිත අයිතිවාසිකම් පිළිබඳ මූලධර්මය සමඟද සම්බන්ධ වේ.

ඒ අනුව, දිට්වා සුළි කුණාටුව ආශ්‍රිත ආපදා කළමනාකරණය සමානාත්මතාවය යනු සෑම පුද්ගලයෙකුටම එකම ආකාරයෙන් සැලකීම යන සීමිත අදහසෙන් ඔබ්බට ගෙන යා යුතු බව පෙන්වා දෙයි. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ Article 12(2) හි වෙනස්කම් නොකිරීමේ

[27] ibid art 11.

මූලධර්මය, **Convention on the Rights of Persons with Disabilities (CRPD) Article 5(4)** හි විශේෂ පියවර සම්බන්ධ ප්‍රවේශය සහ **Article 11** හි ආපදා අවස්ථාවල ආබාධිත පුද්ගලයන් ආරක්ෂා කිරීමේ වගකීම එකට කියවීමෙන්, ආබාධිත ප්‍රජාව සඳහා විශේෂ ආපදා ආරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම වෙනස්කම් කිරීමක් නොව සාරභූත සමානාත්මතාවය සහ මානව ගෞරවය තහවුරු කිරීමේ අවශ්‍ය පියවරක් බව පැහැදිලි වේ.[123]

<u>සමානාත්මතාවයේ අයිතිය සහ දිට්වා සුළිකුණාටුව</u>

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **12(1)** වගන්තිය අනුව, "සියලු දෙනා නීතිය ඉදිරියේ සමාන වන අතර නීතියේ සමාන ආරක්ෂාවට හිමිකම් ලබති."[28] දිට්වා සුළිකුණාටුව වැනි ස්වභාවික ආපදා තත්ත්වයකදී, ආපදාවෙන් පීඩාවට පත් පුද්ගලයන්ට සහන ලබාදීමේදී රාජ්‍යය අත්තනෝමතික හෝ වෙනස්කම් සහිත ආකාරයකින් කටයුතු නොකළ යුතුය.

ශ්‍රේෂ්ඨාධිකරණය ***Palihawadana v Attorney-General and Others*** හිදී **Article 12** යටතේ සමානාත්මතාවය අත්තනෝමතික ලෙස වරප්‍රසාද ලබාදීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන බව අවධාරණය කළේය.[29]එබැවින් දිට්වා සුළිකුණාටුවෙන් පීඩාවට පත් පුද්ගලයන් අතර සහන දීමනා බෙදාහැරීමේදී පුද්ගලික හිතවත්කම්, දේශපාලන බලපෑම් හෝ අදාළ නොවන කරුණු මත පුද්ගලයන් තෝරා ගැනීම **Article 12(1)** හි සමානාත්මතාවයේ අයිතියට පටහැනිය.

එසේ වුවද, සමානාත්මතාවය යනු සෑම පුද්ගලයෙකුටම සෑම අවස්ථාවකදීම එකම ආකාරයෙන් සැලකීම පමණක් නොවේ. ***W P S Wijerathna v Sri Lanka Ports Authority and Others*** හිදී ශ්‍රේෂ්ඨාධිකරණය **Article 12(1)** යටතේ ඇති සමානාත්මතාවය පුළුල් අර්ථයකින්, **substantive equality** හෙවත් හරයාත්මක සමානාත්මතාවය ද ඇතුළත් වන බව පැහැදිලි කළේය.[30]අධිකරණය පෙන්වා දුන්නේ **Article 12(1)** මගින් අත්තනෝමතික, අසාධාරණ සහ අයුක්තිසහගත රාජ්‍ය ක්‍රියාමාර්ගවලින් පුද්ගලයන් ආරක්ෂා කිරීම ද අරමුණු කරන බවයි.[31]

---

[28] Constitution of the Democratic Socialist Republic of Sri Lanka 1978, art 12(1).

[29] Palihawadana v Attorney-General and Others [1978–79–80] 1 SLR 65, 77.

[30] W P S Wijerathna v Sri Lanka Ports Authority and Others SC (FR) Application No 256/2017, SC Minutes, 11 December 2020.

[31] ibid.

ඒ අනුව, දිට්වා සුළිකුණාටුවෙන් පසු සහන බෙදාහැරීමේදී (**affirmative action**) විශේෂ ආරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය විය හැකිය. විශේෂයෙන් ළමුන්, **මෑතකදී බිහිවූ දරුවන්, ගර්භනී කාන්තාවන්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයන් සහ අනෙකුත් විශේෂ අවදානමකට ලක්විය හැකි ආන්තිකකරණයට ලක් වූ කණ්ඩායම් සඳහා අමතර සහන, ප්‍රමුඛතා සේවා සහ** වැඩි සහන දීමනා ලබාදීම අසාධාරණ වෙනස්කමක් ලෙස නොසැලකිය යුතුය. ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා සලකා එවැනි වෙනස් ප්‍රතිකාරයක් ලබාදීමෙන් සමානාත්මතාවය සැබෑ වශයෙන් සාක්ෂාත් කරගත හැකිය.

තවද, ***Palihawadana v Attorney-General and Others*** නඩුවේ පිළිගත් **reasonable classification** සාධාරණ වර්ගීකරණය මූලධර්මය අනුව, පුද්ගලයන් අතර වර්ගීකරණයක් සිදු කළ හැකි වුවද, එම වර්ගීකරණයට අදාළ සහ සාධාරණ පදනමක් තිබිය යුතුය.[32] එබැවින් දිට්වා සහන දීමනා බෙදාහැරීමේදී පුද්ගලයන්ගේ හා පවුල්වල සැබෑ අවශ්‍යතාව, නිවාස හානි මට්ටම, ආදායම් තත්ත්වය සහ විශේෂ අවදානම් තත්ත්වයන් වැනි අදාළ කරුණු මත පදනම් වූ වර්ගීකරණයක් සිදු කිරීම **Article 12(1)** සමඟ අනුකූල විය හැකිය.

එබැවින් දිට්වා සුළිකුණාටුවෙන් පසු සහන බෙදාහැරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය(**formal equality**)විධිමත් සමානාත්මතාවය පමණක් නොව (**substantive equality**) හරයාත්මක සමානාත්මතාවය මත පදනම් විය යුතුය. අවශ්‍යතාවයෙන් වැඩි ,පීඩාවට පත් වූ පුද්ගලයන්ට වැඩි සහන ලබාදීම, විශේෂයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා (**affirmative action**) විශේෂ ආරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම, **Article 12(1)** යටතේ ඇති සමානාත්මතාවයේ අයිතිය වඩාත් ඵලදායී ලෙස සාක්ෂාත් කරගැනීමට උපකාරී වේ.

<u>දිට්වා සුළි කුණාටුව: තොරතුරු දැනගැනීමේ අයිතිය, භාෂා ප්‍රවේශය සහ ඵලදායී ආපදා අනතුරු ඇඟවීම්</u>

දිට්වා සුළි කුණාටුව සම්බන්ධ අත්දැකීම, ආපදා තත්ත්වයකදී තොරතුරු දැනගැනීමේ අයිතිය මානව හිමිකම් ආරක්ෂා කිරීම පිණිස වැදගත් කාර්යභාරයක් සිදු කරයි. පුද්ගලයන්ගේ ජීවිත හා මහජන ආරක්ෂාවට ආසන්න හා දැඩි අවදානමක් පවතින අවස්ථාවකදී, නිවැරදි, කාලෝචිත සහ ජනතාවට අවබෝධ කරගත හැකි ආකාරයකින් තොරතුරු වෙත ප්‍රවේශ වීම හුදෙක් පරිපාලන අවශ්‍යතාවයක් නොව, මානව හිමිකම් ඵලදායී ලෙස ආරක්ෂා කිරීමේ අත්‍යවශ්‍ය අංගයකි.[33]

[32] Palihawadana v Attorney-General and Others [1978–79–80] 1 SLR 65, 77.

[33] International Covenant on Civil and Political Rights (adopted 16 December 1966, entered into force 23 March 1976) 999 UNTS 171, art 6.

විශේෂයෙන්ම, රතු අනතුරු ඇඟවීම් **(Red Alerts)** සහ අනෙකුත් ආපදා පූර්ව අනතුරු ඇඟවීම් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ජනතාව වෙත බෙදාහැරීම මානව හිමිකම් දෘෂ්ටිකෝණයෙන් බලන කල්හි විශේෂ වැදගත්කමක් දරයි. අනතුරු ඇඟවීමක් නිකුත් කිරීම පමණක් තොරතුරු සඳහා ඵලදායී ප්‍රවේශයක් සහතික නොකරයි. එම තොරතුරු බලපෑමට ලක්වන ජනතාවට ඔවුන්ට අවබෝධ වන භාෂාවකින් සහ ඔවුන්ට ප්‍රවේශ විය හැකි සන්නිවේදන මාධ්‍ය ඔස්සේ කඩිනමින් ලැබිය යුතුය.

එවැනි තොරතුරු ජනතාවට ලැබීම මඟින් අවදානමේ ස්වභාවය සහ තීව්‍රතාව අවබෝධ කර ගැනීමටත්, ඉවත් වීම, ආරක්ෂිත ස්ථාන වෙත යාම සහ අනෙකුත් ආරක්ෂක ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කාලෝචිත තීරණ ගැනීමටත් හැකියාව ලැබේ. එබැවින්, ආපදා අනතුරු ඇඟවීම් ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම ජීවත්වීමේ අයිතිය ආරක්ෂා කිරීම සඳහා ගත යුතු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක කොටසක් ලෙස සැලකිය හැකිය.[34]

මෙම තත්ත්වය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **14A** ව්‍යවස්ථාවෙන් සහ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතෙන් සහතික කර ඇති තොරතුරු දැනගැනීමේ අයිතිය සමඟ සෘජුව සම්බන්ධ වේ.[35] විශේෂයෙන්ම ආපදා තත්ත්වයකදී, තොරතුරු දැනගැනීමේ අයිතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම යනු තොරතුරු ඉල්ලා සිටින පුද්ගලයන්ට පමණක් තොරතුරු ලබාදීම නොව, ජීවිත හා ආරක්ෂාව ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය තීරණාත්මක තොරතුරු මහජනතාව වෙත ක්‍රියාකාරීව හා කඩිනමින් බෙදාහැරීම ද ඇතුළත් විය යුතුය.

සාකච්ඡාවේදී අනාවරණය වූ පරිදි, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය **(DMC)** විසින් SMS මඟින් අනතුරු ඇඟවීම් ජනතාව වෙත යොමු කර තිබුණද, මෙවැනි විද්‍යුත් සන්නිවේදන ක්‍රමයක් පමණක් මත රඳා පැවතීම ආපදා අවස්ථාවකදී ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වේ. විදුලි බලය ඇණහිටීම, ජංගම දුරකථන බැටරි අවසන් වීම, charging පහසුකම් නොමැති වීම, ජංගම දුරකථන ජාල බිඳවැටීම සහ අනෙකුත් විද්‍යුත් උපකරණ ක්‍රියා විරහිත වීම හේතුවෙන් SMS පණිවිඩයක් නිකුත් කර තිබුණද එය අවදානමට ලක්වූ සැම පුද්ගලයෙකු වෙතම ප්‍රායෝගිකව ළඟා වීම සහතික කළ නොහැක.

මෙහිදී මහවැලි අධිකාරිය විසින් පොලිස් නිලධාරීන් සහ ත්‍රීවීල් වැනි භෞතික හා ජංගම සන්නිවේදන ක්‍රම භාවිත කරමින් ජනතාව වෙත අනතුරු ඇඟවීම් ලබාදුන් බව සාකච්ඡාවේදී සඳහන් වීම වැදගත්

---

[34] Human Rights Committee, 'General Comment No 36: Article 6: Right to Life' (3 September 2019) UN Doc CCPR/C/GC/36, paras 26 and 62.

[35] Constitution of the Democratic Socialist Republic of Sri Lanka 1978, art 14A; Right to Information Act No 12 of 2016 (Sri Lanka).

වේ. මෙවැනි ක්‍රම මඟින් විදුලිය හෝ ඩිජිටල් සන්නිවේදන පහසුකම් නොමැති අවස්ථාවකදී පවා අනතුරු ඇඟවීම් ජනතාව වෙත ළඟා කිරීමේ හැකියාව පවතින බව පෙන්වා දෙයි.

කෙසේ වෙතත්, මෙවැනි **manual warning mechanisms** ආයතනයක හෝ නිලධාරීන්ගේ ස්වෙච්ඡා ක්‍රියාමාර්ග මත පමණක් රඳා පැවතීම ප්‍රමාණවත් නොවේ. ඒවා ජාතික ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියේ නිල, විධිමත් සහ අනිවාර්ය අංගයක් බවට පත් කළ යුතුය. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (**DMC**) මඟින් අනතුරු ඇඟවීමක් නිකුත් කිරීමෙන් අනතුරුව එම තොරතුරු ප්‍රාදේශීය මට්ටම දක්වා ගෙනයාම සඳහා පොලිසිය, මහවැලි අධිකාරිය, ප්‍රාදේශීය පරිපාලන ආයතන, ග්‍රාම නිලධාරීන් සහ අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන අතර පැහැදිලි වගකීම් සහිත සන්නිවේදන දාමයක් පැවතීම අත්‍යවශ්‍ය වේ.

තවද, සෑම පුද්ගලයෙකුටම ස්මාර්ට් දුරකථන, ජංගම ජාල, අන්තර්ජාලය හෝ වෙනත් තාක්ෂණික පහසුකම් සඳහා අඛණ්ඩ ප්‍රවේශයක් නොමැති බැවින්, ඩිජිටල් සන්නිවේදනය මත පමණක් රඳා සිටීම මඟින් ඇතැම් ප්‍රජාවන් ආපදා තොරතුරුවලින් බැහැර වීමේ අවදානමක් ඇති කරයි. විශේෂයෙන්ම දුරස්ථ ප්‍රදේශවල ජනතාව, වැඩිහිටියන්, ආබාධ සහිත පුද්ගලයන් සහ තාක්ෂණික පහසුකම් සීමිත පුද්ගලයන් සම්බන්ධයෙන් මෙම කරුණ වඩාත් වැදගත් වේ.

ඒ අනුව, ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය බහු-භාෂා සහ බහු-මාධ්‍ය පද්ධතියක් විය යුතු අතර, SMS, රූපවාහිනී, ගුවන්විදුලි සහ අන්තර්ජාල මාධ්‍ය වැනි, තාක්ෂණික පද්ධති අසාර්ථක වන අවස්ථාවලදී ක්‍රියාත්මක කළ හැකි **manual** සහ **community-based warning mechanisms** ද අනිවාර්යයෙන් ඇතුළත් කළ යුතුය. පොලිස් වාහන, ජංගම ශබ්ද විකාශන යන්ත්‍ර, ත්‍රීවීල්, සයිරන් පද්ධති, නිවසින් නිවසට දැනුම්දීම් සහ ප්‍රජා නායකයන් හරහා සෘජු දැනුම්දීම් වැනි ක්‍රම ඒ සඳහා භාවිත කළ හැකිය.

මෙවැනි ක්‍රමවේදයන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම මෙන්ම සංඥා භාෂාවද යොදා ගැනීමේ දී අවදානමට ලක්වන ප්‍රජාවන්ට පහසුවෙන් අවබෝධ වන සරල භාෂාවකින් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. මෙය තොරතුරු වෙත සමාන ප්‍රවේශය තහවුරු කිරීමට මෙන්ම, තාක්ෂණික පහසුකම් නොමැති වීම හේතුවෙන් කිසිදු පුද්ගලයෙකු අත්‍යවශ්‍ය ජීවිතාරක්ෂක තොරතුරුවලින් බැහැර නොවීම සහතික කිරීමටද වැදගත් වේ.

ඒ අනුව, දිට්වා සුළි කුණාටුවෙන් පෙනී යන්නේ ආපදා කළමනාකරණයේදී "අනතුරු ඇඟවීම නිකුත් කළාද?" යන්න පමණක් නොව, "එම අනතුරු ඇඟවීම අවදානමට ලක්වූ සෑම පුද්ගලයෙකු වෙතම, නිවැරදි වේලාවේදී, අවබෝධ වන භාෂාවකින් සහ ප්‍රායෝගිකව ප්‍රවේශ විය හැකි ආකාරයෙන් ළඟා වූවාද?" යන්නද සලකා බැලිය යුතු බවයි.

එබැවින්, අනාගත ආපදා කළමනාකරණ ක්‍රමවේදයන්හිදී සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් අනතුරු ඇඟවීම් සහ ආරක්ෂක උපදෙස් බහු සන්නිවේදන මාධ්‍ය ඔස්සේ කඩිනමින් බෙදාහැරීම සහතික කළ යුතු අතර, විදුලි බලය, ජංගම ජාල හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික පහසුකම් අසාර්ථක වූ අවස්ථාවලදී වහාම ක්‍රියාත්මක කළ හැකි, විධිමත් සහ පරීක්ෂා කරන ලද **manual warning mechanism** එකක්ද ජාතික පද්ධතිය තුළ ස්ථාපිත කළ යුතුය. එය විනිවිදභාවය හා රාජ්‍ය වගවීම ශක්තිමත් කිරීමට මෙන්ම ජීවත්වීමේ අයිතිය, පුද්ගල ආරක්ෂාව, භාෂා ප්‍රවේශය සහ මානව ගෞරවය ආරක්ෂා කිරීමටද දායක වේ.

<u>දිට්වා සුළි කුණාටුව සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවල නෛතික වගකීම</u>

දිට්වා සුළිකුණාටුව පෙර හා පසු පලාත් පාලන ආයතන වල වගකීම පිළිබඳ විශ්ලේෂණයේදී, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අදාළ පනත් එනම්, 1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනත, 1939අංක 61 දරන නගර සභා ආඥාපනත, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යනාදී නෛතික ප්‍රතිපාදන මෙහිදී සාකච්ඡා කරනු ලැබේ.

දිට්වා සුළි කුණාටුවට පෙර අනතුරුදායක තත්ත්වයන් පිළිබඳව අදාළ බලධාරීන් දැනුවත්ව සිටියේ නම්, එම අවදානම් අවම කිරීම සඳහා ඔවුන්ට පැවරී ඇති නීතිමය කාර්යයන් නිසි පරිදි ඉටු කළේද යන්න දිට්වා සුළි කුණාටුවට පෙර පළාත් පාලන බළධාරීන්ගේ වගකීම යටතේ විමර්ශනය කළ යුත්තකි.

එසේම, සුළි කුණාටුවෙන් පසු පීඩාවට පත් ජනතාවට සහන සැලසීමේදී නීතියට අනුකූලව, සාධාරණව සහ වෙනස්කම් කිරීමකින් තොරව කටයුතු කළේද යන්න පශ්චාත් සුළිකුණාටුව විෂයෙහි පළාත් පාලන බළධාරීන්ගේ වගකීම යටතේ විමර්ශනයට ලක් කළ හැකිය.

<u>දිට්වා සුළි කුණාටුවට පෙර පළාත් පාලන ආයතනවල නීතිමය වගකීම</u>

පළාත් පාලන ආයතන යනු මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වේ.ඒවායේ වගකීම් අදාළ ආඥාපනත් සහ පනත් මඟින් තීරණය කරනු ලබන අතර, සියලුම ආපදා කළමනාකරණ වගකීම් එක් පළාත් පාලන ආයතනයකට පමණක් පැවරී ඇති බව උපකල්පනය කළ නොහැකිය.

<u>මහ නගර සභා</u>

1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනත යටතේ පාලනය වන මහ නගර සභාවන්හි බලතල හා කාර්යභාර්ය විමසීමේදී ආඥා පනතේ 96 සහ 97 වගන්ති මහජන සෞඛ්‍යය හා පොදු ජලාපවහනය සම්බන්ධ කාර්යයන් සඳහා අදාළ වේ. [36]ඒ අනුව, සුළි කුණාටුවට පෙර, මහ නගර

[36] Municipal Councils Ordinance (Sri Lanka) No 29 of 1947, ss 96–97.

සභාවේ වගකීම යටතේ පවතින කාණු පද්ධති, බෝක්කු සහ ජලාපවහන මාර්ග නිසි පරිදි නඩත්තු කළේද, නිතර ගංවතුර ඇතිවන ස්ථාන හඳුනාගෙන අවදානම් අවම කිරීමට පියවර ගෙන තිබුණේද, ජලාපවහන පද්ධති අවහිර වී තිබීම පිළිබඳ පැමිණිලි ලැබී තිබුණේ නම්, ඒවාට ප්‍රතිචාර දක්වා තිබුණේද, සුළි කුණාටුව පිළිබඳ අනතුරු ඇඟවීම් ලැබුණු විට අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කළේද, ජනතාවගේ සෞඛ්‍යයට හා ආරක්ෂාවට ඇතිවිය හැකි අවදානම් අවම කිරීම සඳහා තම බලතල යටතේ ගත හැකි සාධාරණ පියවර ගත්තේද, යන කරුණු මගින් මහ නගර සභාවට පැවරී තිබූ නීතිමය කාර්යයන් නිසි පරිදි ඉටු කර තිබේද යන්න තක්සේරු කළ යුතුය.

<u>නගර සභා</u>

1939අංක 61 දරන නගර සභා ආඥාපනත යටතේ පාලනය වන නගර සභාවන්හි බලතල හා කාර්යභාර්ය විමසීමේදී, නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය නගර සභාවේ පොදු කාර්යයන් සම්බන්ධයෙන් වැදගත් වන අතර, 103–105 වගන්ති මහජන සෞඛ්‍යය හා ජලාපවහනය සම්බන්ධයෙන් අදාළ වේ.[37]

සුළි කුණාටුවට පෙර, නගර සභාවේ වගකීම විමර්ශනයේදී ,තම බල ප්‍රදේශයේ පොදු කාණු හා ජලාපවහන පද්ධති නඩත්තු කිරීම, අවදානම් සහිත පොදු මාර්ග හා යටිතල පහසුකම් සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම, සුළි කුණාටුවට පෙර ලැබුණු අනතුරු ඇඟවීම්වලට අදාළව තමන්ට පැවරී ඇති වගකීම් ඉටු කිරීම, අවදානම් සහිත ප්‍රදේශවල ජනතාව ආරක්ෂා කිරීම සඳහා අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීම සිදු කළේද යන්න සලකා බැලිය යුතුය.

<u>ප්‍රාදේශීය සභා</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පාලනය වන ප්‍රාදේශීය සභාවන්හි බලතල හා කාර්යභාර්ය විමසීමේදී, ප්‍රාදේශීය සභා පනතේ 78–80 වගන්ති මහජන සෞඛ්‍යය, පොදු ජලාපවහනය සහ අදාළ නඩත්තු කාර්යයන් සම්බන්ධයෙන් වැදගත් වේ.[38]

සුළි කුණාටුවට පෙර, ප්‍රාදේශීය සභාවේ වගකීම විමර්ශනයේදී, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යටතේ පවතින කාණු, බෝක්කු සහ ජලාපවහන පද්ධති නිසි පරිදි නඩත්තු කර තිබුණේද, නිතර ගංවතුර ඇතිවන ගම්මාන හා මාර්ග හඳුනාගෙන තිබුණේද, පෙර ලැබුණු පැමිණිලි සහ අනතුරු ඇඟවීම්වලට අනුව පියවර ගෙන තිබුණේද,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ග්‍රාම නිලධාරීන් සහ ආපදා කළමනාකරණ බලධාරීන් සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වා තිබුණේද, සුළි

[37] Urban Councils Ordinance (Sri Lanka) No 61 of 1939, ss 4, 103–105.
[38] Pradeshiya Sabhas Act (Sri Lanka) No 15 of 1987, ss 78–80.

කුණාටුවෙන් පසු හානි වූ යටිතල පහසුකම් හා මහජන සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් ක්‍රියා කර තිබුණේද යන්න විමසා බැලිය යුතුය.

<u>දිට්වා සුළි කුණාටුවට පසු පළාත් පාලන ආයතනවල නීතිමය වගකීම</u>

දිට්වා සුළි කුණාටුවෙන් පසුව පලාත් පාලන ආයතන වල කාර්යභාරය විමර්ශනයේදී , අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ අදාළ ප්‍රදේශ වල ජීවත් වන ජනතාව වෙත තොරතුරු ලබාදීම, ආපදා අවදානම් අවම කිරීම සහ සූදානම් වීම, ආපදා අවස්ථාවේදී ආයතන අතර සම්බන්ධීකරණය, ජනතාව ඉවත් කිරීම සහ හදිසි සහන කටයුතු සඳහා අදාළ ආයතනවල පාලනය යටතේ පවතින ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල ආදිය ඵලදායිව සහභාගී කරවා ගැනීම, ආපදාවෙන් පසු භෞතික සම්පත් ප්‍රතිසංස්කරණ හා යථා තත්ත්වයට පත් කිරීම ආදිය සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතුය.

එසේ වුවද, ආපදා කළමනාකරණ පනත යටතේ අදාළ ආයතනයට හෝ නිලධාරියාට පැවරී ඇති නිශ්චිත කාර්යභාරය හඳුනාගැනීම අත්‍යවශ්‍යය. සියලුම අනතුරු ඇඟවීම්, ඉවත් කිරීමේ නියෝග හෝ සහන කටයුතු සඳහා පළාත් පාලන ආයතනය පමණක් වගකිව යුතු බව නිගමනය නොකළ යුතුය.

යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම යටතේ, හානි වූ කාණු, බෝක්කු සහ අදාළ පොදු යටිතල පහසුකම් පරීක්ෂා කිරීම, තම බලතල හා සම්පත් අනුව අත්‍යවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කිරීම, අවදානම් සහිත ස්ථාන පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම, නැවත ගංවතුර ඇතිවීමේ අවදානම අවම කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමෙන් අවශ්‍ය පියවර හඳුනාගැනීම.

තවදුරටත්, මහජන සෞඛ්‍යය හා සනීපාරක්ෂාව යටතේ ගංවතුරෙන් පසු එකතු වූ අපද්‍රව්‍ය ඉවත් කිරීම, ජලය හා සනීපාරක්ෂක පද්ධති දූෂණය වීමෙන් ඇතිවිය හැකි අවදානම් හඳුනාගැනීම, මදුරුවන් බෝවීම හා වෙනත් මහජන සෞඛ්‍ය ගැටලු අවම කිරීම සඳහා අදාළ ආයතන සමඟ කටයුතු කිරීම, ගංවතුර වැනි විපතක් සම්බන්ධයෙන් ඇතිවිය හැකි මීළණ වැනි වසංගත රෝග තත්ව පාලනය මර්දනයටත්, ආන්තික කණ්ඩායම් වන ගර්භණී මව්වරුන් සහ දරුවන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීම ආදිය වෛද්‍ය නිලධාරීන් සහ සෞඛ්‍ය බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීම මඟින් සිදුකල යුතුය.

සහන හා පුනරුත්ථාපනය යටතේ පළාත් පාලන ආයතනයට පැවරී ඇති කාර්යයන් අනුව, පීඩාවට පත් පවුල් හඳුනාගැනීමට සහ අදාළ තොරතුරු ලබාදීමට සහාය වීම, සහන අවශ්‍යතා පිළිබඳ අදාළ බලධාරීන් දැනුවත් කිරීම, හානි වූ පොදු පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම, ජනතාවගේ පැමිණිලි සටහන් කර ඒවාට අදාළ ආයතන වෙත යොමු කිරීම,ඉදිරි ආපදා සඳහා සූදානම් වීම වැඩිදියුණු කිරීමට අවශ්‍ය පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ග හඳුනාගැනීම.

පලාත් පාලන ආයතනයන්හි නෛතික වගකීම මූලික අයිතිවාසිකම් යටතේ විශ්ලේෂණය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව අනුව, සියලු පුද්ගලයෝ නීතිය ඉදිරියේ සමාන වන අතර නීතියේ සමාන ආරක්ෂාව ලැබීමට හිමිකම් ලබති.

ඒ අනුව සැලකීමේදී දිට්වා සුළි කුණාටුවෙන් පසු සහන බෙදාහැරීමේදී යම් ප්‍රදේශයක හෝ යම් පිරිසක ජනතාව අසාධාරණ ලෙස බැහැර කර තිබේ නම්, එම ක්‍රියාකලාපය 12(1) ව්‍යවස්ථාව යටතේ විමර්ශනය කිරීමේ හැකි අතර දැනටමත් එවැනි පැමිණිලි කොමිෂන් සභාව ඉදිරියේ විමර්ශනය වෙමින් පවති.[39]

එහෙත් සමානාත්මතාවය උල්ලංඝනය වී ඇති බව තීරණය කිරීම සඳහා අදාළ කරුණු නිශ්චිතව දැක්විය යුතු අතර, වෙනස් සැලකීමේ ස්වභාවය සහ රාජ්‍ය ක්‍රියාකලාපය පරීක්ෂා කළ යුතුය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(g) ව්‍යවස්ථාව යටතේ, නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක හෝ ව්‍යාපාරයක නිරත වීමේ නිදහස ආරක්ෂා කරයි.[40]

සුළි කුණාටුව හේතුවෙන් ව්‍යාපාරික ස්ථාන හෝ රැකියා ස්ථාන හානි වීම පමණක් මත 14(1)(g) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බව නිගමනය කළ නොහැකිය. එහෙත්, අදාළ රාජ්‍ය ක්‍රියාකලාපය හෝ නීතිවිරෝධී සීමා කිරීමක් මෙම අයිතිවාසිකමට බලපා තිබේද යන්න අදාළ කරුණු අනුව විමර්ශනය කළ හැකිය.නිදසුනක් වශයෙන් දිට්වා සුළි කුණාටුවෙන් පසු ව්‍යාපාරික ප්‍රජාවට ලබා දුන් දීමනා අසාධාරණ ලෙස ලබා නොදීම දැක්විය හැක.

සමස්ථයක් වශයෙන්, රාජ්‍ය ආයතන වශයෙන් මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා යන රාජ්‍ය පරිපාලනයෙහි පහල ව්‍යුහයන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කර පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් රාජ්‍ය ආයතනයක් වශයෙන් ගරුකිරීමටත් ආරක්ෂා කිරීම සහ ඉදිරියට ගෙන යාමටත් රාජ්‍යය ආයතනයක් වශයෙන් වගකීමක් පවති.[41]

---

[39] The Constitution of the Democratic Socialist Republic of Sri Lanka 1978, art 12(1).
[40]. The Constitution of the Democratic Socialist Republic of Sri Lanka 1978, art 14(1)(g).
[41] The Constitution of the Democratic Socialist Republic of Sri Lanka 1978, art 4.

කාලගුණික විපර්යාස හා දිට්වා සුළිකුණාටුව

දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (United Nations Framework Convention on Climate Change – UNFCCC) හි 1(2) වගන්තිය අනුව, දේශගුණික විපර්යාස යනු මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සෘජුව හෝ වක්‍රව ගෝලීය වායුගෝලයේ සංයුතිය වෙනස් වීම නිසා ඇතිවන, ස්වාභාවික දේශගුණික විචලනයට අමතරව සිදුවන දේශගුණයේ වෙනසකි.[42]

මෙම අර්ථ දැක්වීම අනුව, දේශගුණික විපර්යාස මඟින් අධික වර්ෂාපතනය, ගංවතුර, නායයෑම් සහ අනෙකුත් ආන්තික කාලගුණික සිදුවීම්වල අවදානම හා තීව්‍රතාව ඉහළ යා හැකිය. ශ්‍රී ලංකාවට බලපෑ දිට්වා සුළි කුණාටුව ආශ්‍රිත ආපදා තත්ත්වය දේශගුණික අවදානම්, ආපදා සූදානම සහ මානව හිමිකම් අතර සම්බන්ධතාව විමසා බැලීමට වැදගත් උදාහරණයකි. කෙසේ වෙතත්, දිට්වා සුළි කුණාටුව සෘජුවම දේශගුණික විපර්යාස නිසා ඇති වූවක් බව තීරණය කිරීමට විද්‍යාත්මක සාක්ෂි අවශ්‍ය වේ.

එසේ වුවද, දිට්වා වැනි සුළි කුණාටුවක පසුබිමෙහි පැවතිය හැකි වැදගත් පාරිසරික සාධකයක් ලෙස දේශගුණික විපර්යාස විග්‍රහ කළ හැකිය. දේශගුණික විපර්යාස හේතුවෙන් අධික වර්ෂාපතනය, ගංවතුර සහ නායයෑම් වැනි ආපදා තත්ත්වයන්හි අවදානම හා තීව්‍රතාව ඉහළ යා හැකිය .

මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් විමසීමේදී, 1972 ස්ටොක්හෝම් මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව මඟින් මානව ක්‍රියාකාරකම් සහ පාරිසරික හායනය අතර සම්බන්ධතාව අවධාරණය කළ අතර[43], 1992 රියෝ ද ජැනයිරෝ පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව මඟින් තිරසාර සංවර්ධනය, පාරිසරික ආරක්ෂාව සහ අනාගත පරපුරේ යහපැවැත්ම පිළිබඳ මූලධර්ම තවදුරටත් ශක්තිමත් කරන ලදී. [44]එමෙන්ම, 1992 දී සම්මත කරන ලද දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC) මඟින් දේශගුණික පද්ධතියට සිදුවන මානව බලපෑම් අවම කිරීමේ අවශ්‍යතාව පිළිගනු ලැබීය. [45]එබැවින්, දිට්වා සුළි කුණාටුව ආශ්‍රිත ආපදා තත්ත්වය විග්‍රහ කිරීමේදී පාරිසරික ආරක්ෂාව, ආපදා අවදානම් අවම කිරීම, රාජ්‍ය වගකීම සහ ජනතාවගේ ජීවත්වීමේ අයිතිය ඇතුළු මානව හිමිකම් ආරක්ෂා කිරීමේ

---

[42] United Nations Framework Convention on Climate Change (adopted 9 May 1992, entered into force 21 March 1994) 1771 UNTS 107, art 1(2).

[43] United Nations Conference on the Human Environment, Declaration of the United Nations Conference on the Human Environment (Stockholm, 16 June 1972).

[44] United Nations Conference on Environment and Development, Rio Declaration on Environment and Development (Rio de Janeiro, 14 June 1992).

[45] United Nations Framework Convention on Climate Change (adopted 9 May 1992, entered into force 21 March 1994) 1771 UNTS 107.

ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් විෂයෙහි පාර්ශවකාර රාජ්‍යයක් වශයෙන් රාජ්‍ය වගකීම (State responsibility) ඒකාබද්ධව සලකා බැලීම වැදගත් වේ.

තවද මෑත කාලීනව එනම්, 2025 ජූලි 23 දින ජාත්‍යන්තර අධිකරණය (ICJ) විසින් Obligations of States in respect of Climate Change පිළිබඳ ලබාදුන් උපදේශන මතයේදී, දේශගුණික පද්ධතියේ හායනය සහ පාරිසරික හානි මානව හිමිකම් ඵලදායී ලෙස භුක්ති විඳීමට බාධා කළ හැකි බව පිළිගන්නා ලදී. විශේෂයෙන්ම, දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් හේතුවෙන් ජීවත්වීමේ අයිතිය, සෞඛ්‍යයට ඇති අයිතිය, ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් සඳහා ඇති අයිතිය, පවුලක වශයෙන් ජීවත්වීමේ අයිතිය, නිවාස අයිතිය බලපෑමට ලක් විය හැකි බව අධිකරණය අවධාරණය කළේය. එමෙන්ම, දේශගුණික පද්ධතිය ආරක්ෂා කිරීමට සහ මානව හිමිකම් ඵලදායී ලෙස භුක්ති විඳීම තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම රාජ්‍යයන්ගේ ජාත්‍යන්තර නීතිමය වගකීමක් බව පැහැදිලි කළේය. [46]ඒ අනුව, දිට්වා සුළි කුණාටුවෙන් නිවාස අහිමිවීම, ජීවනෝපායන් විනාශවීම, පිරිසිදු ජලය හා ආහාර ලබාගැනීමේ දුෂ්කරතා සහ සෞඛ්‍ය අවදානම් ඇති වූයේ නම්, ඒවා ජාත්‍යන්තර මානව හිමිකම් දෘෂ්ටිකෝණයෙන් විමර්ශනය කළ හැකිය. තවද, ආපදා අවදානම් අවම කිරීම, පූර්ව අනතුරු ඇඟවීම් ලබාදීම සහ ජනතාව ආරක්ෂා කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතන ගත් පියවර ප්‍රමාණවත්ද යන්නද රාජ්‍ය වගකීම යටතේ සලකා බැලිය යුතුය.

ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් සමඟ ශ්‍රී ලංකාව සිය ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය (National Climate Change Policy – NCCP) අනුකූල කිරීමට පියවර ගෙන ඇත.[47] ඒ අනුව, 1992 එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC), 2015 පැරිස් ගිවිසුම සහ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) මඟින් අවධාරණය කරන දේශගුණික විපර්යාස අවම කිරීම, ඒවාට අනුවර්තනය වීම සහ දේශගුණික අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීමේ අරමුණු ජාතික ප්‍රතිපත්තියට ඇතුළත් කර ඇත.[48] තවද, පැරිස් ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරනු ලබන ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව වාර්තාව (Nationally Determined

---

[46] Obligations of States in respect of Climate Change (Advisory Opinion) [2025] ICJ (23 July 2025), paras 371–382.

[47] Ministry of Environment, Sri Lanka, National Policy on Climate Change 2023 (November 2023) https://www.climatechange.lk/CCS2023/NPCC_2023_ENGLISH.pdf� accessed 19 October 2026.

[48] United Nations Framework Convention on Climate Change (adopted 9 May 1992, entered into force 21 March 1994) 1771 UNTS 107; Paris Agreement (adopted 12 December 2015, entered into force 4 November 2016) UN Doc FCCC/CP/2015/10/Add.1.

Contributions – NDCs) මඟින්[49] හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සහ දේශගුණික බලපෑම්වලට මුහුණ දීම සඳහා ජාතික ක්‍රියාමාර්ග සැලසුම් කරනු ලබයි. එමෙන්ම, තිරසාර සංවර්ධන අරමුණු අතර 13 වන අරමුණ මඟින් දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවධාරණය කරයි.[50]

එමෙන්ම, 2025 ජූලි 23 දින ජාත්‍යන්තර අධිකරණය (ICJ) විසින් ලබාදුන් දේශගුණික විපර්යාස පිළිබඳ උපදේශන මතය මඟින් පැහැදිලි කරන ලද ජාත්‍යන්තර නීතිමය බැඳීම් ද ශ්‍රී ලංකාවේ දේශගුණික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී වැදගත් වේ. ඒ අනුව, දිට්වා සුළි කුණාටුව වැනි ආපදා හමුවේ පූර්ව අනතුරු ඇඟවීම් ශක්තිමත් කිරීම, අවදානම් සහිත ජනතාව ආරක්ෂා කිරීම, ආපදා කළමනාකරණය කාර්යක්ෂම කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම තුළින් ජාත්‍යන්තර ප්‍රමිතීන් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම අවධාරණය කළ හැකිය. කෙසේ වෙතත්, ජාතික ප්‍රතිපත්තියක් ජාත්යන්තර ප්‍රමිතීන් සමඟ අනුකූලව සකස් කිරීම ප්‍රමාණවත් නොවේ. එය ප්‍රායෝගිකව සාර්ථකව ක්‍රියාත්මක වීම තුලින් එහි ඵලදායිත්වය නිර්ණය කල හැකි අතර එමඟින් දිට්වා වැනි සුළිකුණාටු වලට හේතුවිය හැකි මූලික හේතු අවම කරගත හැකිය.

විමර්ශන වාර්තා සාරාංශය, කරුණු විශ්ලේෂණය සහ අවසාන නිගමනය

<u>පැමිණිලිකරුවන්ගේ ප්‍රධාන චෝදනා සහ ඉල්ලීම්</u>

- **පළමුවන පැමිණිලිකරු (මහින්ද දේශප්‍රිය මයා - HRC/HO/4814/25):** 2025 නොවැම්බර් 26 සිට 30 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට බලපෑ ස්වභාවික ආපදාවලදී හානි අවම කිරීමට රාජ්‍ය ආයතන නිසි පූර්වෝපාය ගෙන තිබේද යන්න පිළිබඳ පුළුල් විමර්ශනයක් ඉල්ලා සිටියි.
- **දෙවන පැමිණිලිකරු (ඒ. පෙරේරා මිය - HRC/HO/4494/25):** ඉන්දියානු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ (IMD) අනතුරු ඇඟවීම් නිසි ලෙස හඳුනා නොගැනීම නිසා පුද්ගලයින් 600කට අධික පිරිසක් මිය යාම බරපතළ පරිපාලන දුර්වලතාවක් බව පෙන්වා දෙයි.
- **තෙවන පැමිණිලිකරු (සී. අමරසිංහ මයා - HRC/HO/82/26):** ජංගම දුරකථන කෙටි පණිවිඩ මඟින් කඩිනමින් ජනතාව දැනුවත් නොකිරීම, කොත්මලේ ජලාශයේ වාන් දොරටු විවෘත කිරීමට පෙර පහත් බිම් ජනතාව සූදානම් නොකිරීම, විදුලිය හා සන්නිවේදනය බිඳ වැටීම සහ ඉන්ධන ලබාගැනීමේ ගැටලු සම්බන්ධයෙන් චෝදනා නඟයි.

---

[49] Government of Sri Lanka, Sri Lanka's Nationally Determined Contributions 3.0 (2026–2035) (September 2025)

[50] UN General Assembly, Transforming Our World: The 2030 Agenda for Sustainable Development UNGA Res 70/1 (25 September 2015) UN Doc A/RES/70/1, Goal 13.

- **සිව්වන පැමිණිලිකරු (එස්. එරන්ද ගුණදාස මයා - HRC/HO/4896/25):** කොත්මලේ ජලාශයේ වාන් දොරටු හදිසියේ සහ පූර්ව දැනුම්දීමකින් තොරව විවෘත කිරීම නිසා ගම්පොළ ප්‍රදේශයට ඇති වූ ගංවතුර තත්ත්වයට මහවැලි අධ්‍යක්ෂ ජනරාල් සහ ජලාශ භාර ඉංජිනේරුවරයා වගකිව යුතු බවට චෝදනා කරයි.

<u>අදාළ රාජ්‍ය ආයතනවල ප්‍රතිචාර</u>

- **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව:** නොවැම්බර් 23 දින සිට අඩු පීඩන කලාප පිළිබඳ පූර්ව හඳුනාගැනීම් සිදු කර ඇති අතර, නොවැම්බර් 25 වන දින ප්‍රථම "රතු" අනතුරු ඇඟවීමේ නිවේදනය නිකුත් කර ඇත. SOP ක්‍රියාපටිපාටියට අනුව නොවැම්බර් 27 සිට 30 දක්වා කාලය තුළ රතු නිවේදන 31ක් නිකුත් කරමින් නිරන්තරයෙන් පාර්ශවකරුවන් දැනුවත් කර ඇති බව දන්වා සිටියි.

- **වාරිමාර්ග දෙපාර්තමේන්තුව:** 2025.11.25 දින සිට සියලුම ගංගා සඳහා ඇම්බර් මට්ටමේ ගංවතුර අනතුරු ඇඟවීම් නිකුත් කළ බවත්, ඩෑෂ් බෝඩ් (Dash Board) හරහා පැය 24 පුරා ජල මට්ටම් අධීක්ෂණය කරමින් අදාළ ආයතන හා මාධ්‍ය නිරන්තරයෙන් දැනුවත් කළ බවත් ප්‍රකාශ කරයි.

- **ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය:** කොත්මලේ ජලාශයේ ජල මට්ටම පාලනය කරමින්, 2025.11.26 සහ 27 දිනවල වාන් දොරටු විවෘත කිරීමට පෙර මාධ්‍ය, ප්‍රාදේශීය නිලධාරීන්, පොලිසිය සහ WhatsApp සමූහ හරහා නිලධාරීන් දැනුවත් කර ඇති බව සඳහන් කරයි. පැමිණිලිකරුගේ ගණනය කිරීම් සහ චෝදනා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරයි.

- **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC):** 2025.11.17, 20, 24 සහ 26 යන දිනවල Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධීකරණ රැස්වීම් පවත්වා ඇති අතර, ත්‍රිවිධ හමුදාව, පොලිසිය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමඟ එක්ව ආපදා අවම කිරීමේ හා මුදාගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කර ඇත.

කරුණු විශ්ලේෂණය සහ කාලරාමුව පෙත්සම්කාරියගේ චෝදනාවන්ට අනුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව "සෙන්යාර්" සුළි කුණාටුවක් ගැන (නොවැම්බර් 18 දින සිට) සඳහන් කළද, 2025.11.27 දින ඉන්දියාව විසින් "දිට්වා" නමින් සුළි කුණාටුවක් ආරම්භ වූ බව පැහැදිලිව සඳහන් කර තිබියදී, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පස්වරු 1.00ට සිදුකළ දැනුම් දීමේදී ඉදිරි පැය 12

තුළ සුළි කුණාටුවක් ඇති විය හැකි බවට ප්‍රකාශ කිරීම තුළ යම් ප්‍රමාදයක් පවතින බව නිරීක්ශන වේ . එසේම, නොවැම්බර් 27 සිට 30 දක්වා කාලය තුළ රතු නිවේදන 31ක් නිකුත් කර තිබුණද, වෙරළ ආශ්‍රිත සහ නායයෑම් අවදානම් සහිත පළාත්වල ජනතාවට මීට වඩා නිශ්චිතව අවදානම් තත්ත්වය දැනුවත් කිරීමේ අවශ්‍යතාවය පවතින බව ද නිරීක්ෂණය වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 වගන්ති සහ නීතිමය වගකීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන වගන්තියට අනුව පරමාධිපත්‍යය ජනතාව සතු වන අතර, 4 වන වගන්තිය මඟින් විධායක බලය ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය ආයතන වෙත පවරා ඇත්තේ භාරකාරීත්වයකි. 'සෙන්යාර්' සහ 'දිට්වා' වැනි සුළි කුණාටු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් සහ රතු නිවේදන කල්තියා ලැබී තිබියදීත්, පහත් බිම්වල ජනතාවට කඩිනමින් ඉවත් වීමට ප්‍රමාණවත් සන්නිවේදන ක්‍රමවේද සැකසීමට අපොහොසත් වීම ව්‍යවස්ථාපිත භාරකාරීත්වය සහ ජීවත්වීමේ අයිතිය ඇතුළු මූලික අයිතිවාසිකම් සම්බන්ධයේ ගැටළුකාරි තත්වයක් නිර්මාණය කර ඇත.[51]

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(2)(c) ව්‍යවස්ථාව අනුව, පුද්ගලයන්ට සහ පවුල්වලට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් සහ ජීවන තත්ත්වය අඛණ්ඩව වැඩිදියුණු කරගැනීමේ අවස්ථා සැලසීම රාජ්‍ය ප්‍රතිපත්ති යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස දක්වා ඇත.[52]මෙම ව්‍යවස්ථාව රාජ්‍ය ප්‍රතිපත්ති විශ්ලේෂණයට වැදගත් වුවද, 29 වන ව්‍යවස්ථාව අනුව රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම අධිකරණයක බලාත්මක කළ නොහැකිය.[53]එබැවින්, 27(2)(c) ව්‍යවස්ථාව පමණක් පදනම් කරගෙන මූලික අයිතිවාසිකම් කඩවීමක් නිර්ණය කල නොහැක. එසේ වුවද රාජ්‍ය ආයතන වශයෙන් උක්ත රාජ්‍ය ප්‍රතිපත්තිමය අරමුණු ආරක්ෂා කිරීමට දිට්වා සුළි කුණාටුව වැනි ව්‍යසනයකදී වුවද අත් නොහල හැකි යුතුකමක් පවතී.

කෙසේ වෙතත්, ***Saman v. Leeladasa and Another*** නඩුවේදී, ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දී ඇති පරිදි, රාජ්‍ය නිලධාරියෙකුගේ වගකීම ඔහුගේ නිල තනතුර හෝ ඔහු යටතේ සිටින නිලධාරියෙකු විසින් සිදු කළ ක්‍රියාවක් පමණක් මත ස්වයංක්‍රීයව පැන නොනඟී. එවැනි වගකීමක් තීරණය කිරීමේදී, අදාළ ක්‍රියාව හෝ අතපසු කිරීම නිලධාරියාට පවරා ඇති රාජකාරි හා බලතල සමඟ ඇති සම්බන්ධතාවය මෙන්ම, එම ක්‍රියාව සඳහා ඔහු විසින් අවසර දී තිබේද, එය අනුමත කර තිබේද, හෝ එය පසුව අනුමත කර පිළිගෙන තිබේද යන්න සලකා බැලිය යුතුය.[54]

---

[51]The Constitution of the Democratic Socialist Republic of Sri Lanka 1978, arts 3–4.
[52] The Constitution of the Democratic Socialist Republic of Sri Lanka 1978, art 27(2)(c).
[53] The Constitution of the Democratic Socialist Republic of Sri Lanka 1978, art 29.
[54] Saman v Leeladasa [2000] 1 Sri LR 176.

ඒ අනුව, යම් රාජ්‍ය නිලධාරියෙකුට පෞද්ගලික වගකීමක් පැවරීමට නම්, ඔහුගේම ක්‍රියාවක්, අතපසු කිරීමක්, අවසරයක් හෝ අදාළ ක්‍රියාව සමඟ ප්‍රමාණවත් නීතිමය සම්බන්ධතාවයක් පෙන්වන නිශ්චිත කරුණු හා සාක්ෂි මත එම වගකීම ස්ථාපිත කළ යුතුය. හානියක් සිදුවීම පමණක් මත නිලධාරියාගේ පෞද්ගලික වගකීම ස්වයංක්‍රීයව නිගමනය කළ නොහැකිය.

ස්වාභාවික ආපදාවක් අතරත හානියක් සිදුවීම පමණක් මත රජයේ තනි නිලධාරියෙකුගේ පෞද්ගලික වගකීම හෝ නොසැලකිල්ල ස්වයංක්‍රීයව නිගමනය කළ නොහැකිය. රාජ්‍ය නිලධාරියෙකුගේ වගකීම තීරණය කිරීමේදී ආපදාවේ ස්වභාවය හා තීව්‍රතාව, ඔවුන් සතුව පැවති සම්පත්, එම අවස්ථාවේ තිබූ තොරතුරු (සන්නිවේදන බිඳවැටීම් සහ විදුලිය ඇනහිටීම් වැනි අභියෝග) සහ සාධාරණ ලෙස ගත හැකිව තිබූ ක්‍රියාමාර්ග සැලකිල්ලට ගත යුතුය. මෙහිදී ඔප්පු කිරීමේ භාරය (Burden of Proof) පැමිණිලිකරු මත පැටවෙන අතර, රාජ්‍යය හෝ අදාළ නිලධාරීන් නීතියෙන් නියමිත සාධාරණ සීමාව ඉක්මවා ගොස් ඇති බවට නිශ්චිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

කොමිෂන් සභාවේ ඉදිරි පියවර මෙම ආපදා තත්ත්වය හමුවේ තාක්ෂණික දෝෂ, සන්නිවේදන බිඳවැටීම් සහ පූර්ව දැනුම්දීම් ක්‍රියාවලියේ යම් යම් දුර්වලතා පැවතියද, හුදෙක් හානියක් සිදු වීම පමණක් මත ස්වයංක්‍රීයව කිසිදු නිලධාරියෙකු මත පෞද්ගලික වගකීමක් පැටවිය නොහැක. එබැවින්, අදාළ රාජ්‍ය ආයතන විසින් නිකුත් කරන ලද අනතුරු ඇඟවීම්, ගත් ක්‍රියාමාර්ග සහ නිලධාරීන්ගේ වගකීම් පිළිබඳව පුළුල් හා විධිමත් පරීක්ෂණයක් පවත්වා, ඉදිරි ආපදා කළමනාකරණ යාන්ත්‍රණය තාක්ෂණිකව යාවත්කාලීන කිරීම සඳහා කොමිෂන් සභාව විසින් සුදුසු නිර්දේශ ලබා දීම මෙම විමර්ශනයේ මූලික අරමුණ වේ.

මෙහිදී කොමිෂන් සභාවේ අවධානය ආපදා කළමනාකරණ චක්‍රය කෙරෙහි යොමු කෙරේ

ආපදා කළමනාකරණ චක්‍රය සමන්විත වන්නේ: ප්‍රධාන අදියර 4 කිනි.[55]

ඒවා නම්,

- Mitigation / Risk Reduction (අවදානම් අවම කිරීම)
- Preparedness (සූදානම් වීම)
- Response (ප්‍රතිචාර දැක්වීම.
- Recovery (ප්‍රතිසාධනය/නැවත ගොඩනැගීම)
- **Mitigation / Risk Reduction (අවදානම් අවම කිරීම)**

[55] United Nations Office for Disaster Risk Reduction (UNDRR), Sendai Framework for Disaster Risk Reduction 2015–2030 (UN 2015) 8–9.

Disaster එකක් ඇතිවූ විට සිදුවන හානිය අඩු කිරීමට කලින් කරන ක්‍රියාමාර්ග.

උදා: flood-control systems, strong buildings, hazard mapping.

- **Preparedness (සූදානම් වීම)**

ආපදාවක් ඇතිවීමට පෙර ජනතාව සහ ආයතන සූදානම් කිරීම.

උදා: early-warning systems, evacuation plans, emergency kits, drills.

- **Response (ප්‍රතිචාර දැක්වීම)**

ආපදාව සිදුවන අවස්ථාවේ සහ වහාම පසුව ජීවිත ආරක්ෂා කිරීමට කරන ක්‍රියාමාර්ග.

උදා: evacuation, search and rescue, first aid, emergency shelters.

- **Recovery (ප්‍රතිසාධනය/නැවත ගොඩනැගීම)**

ආපදාවෙන් පසුව ජන ජීවිතය හා යටිතල පහසුකම් නැවත යථා තත්ත්වයට පත් කිරීම.

උදා: damaged houses/roads නැවත ඉදිකිරීම, livelihoods නැවත ආරම්භ කිරීම.

මෙම අදියරයන් දිට්වා සුළිකුණාටුව වැනි ව්‍යසනයන් සම්බන්ධයෙන් ප්‍රායෝගිකව භාවිතා කළ හැකිය.

ආපදා චක්‍රයේ අදියර 04 වෙනුවෙන් ක්‍රියාකළ යුතු මාර්ගෝපදේශ පහත දක්වමු.

මෙම ආපදා කළමනාකරණයේ අදියරයන් වන, Mitigation / Risk Reduction (අවදානම් අවම කිරීම), Preparedness (සූදානම් වීම) , Response (ප්‍රතිචාර දැක්වීම) , Recovery (ප්‍රතිසාධනය/නැවත ගොඩනැගීම) ඇසුරෙන් දිට්වා සුළිකුණාටුවා අදාලව නිර්දේශයන් මෙලෙස දැක්විය හැකිය.

1. අවදානම් අවම කිරීම (Mitigation)

අවදානම් අවම කිරීම යනු ආපදාවක් සිදුවීමට පෙර එම ආපදාවෙන් ඇති විය හැකි ජීවිත හා දේපළ හානි අවම කිරීම සඳහා දිගුකාලීනව ගනු ලබන ක්‍රියාමාර්ග වේ.

දිට්වා සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග:

- ගංවතුර, නායයෑම් සහ මුහුදු රළ ඉහළ යාමේ අවදානම් ප්‍රදේශ හඳුනාගෙන අවදානම් සිතියම් සකස් කිරීම.
- ගංවතුර අවදානම් ප්‍රදේශවල ජලය බැස යාමේ පද්ධති වැඩිදියුණු කිරීම.
- නායයෑම් අවදානම් බෑවුම්වල ඉදිකිරීම් පාලනය කිරීම.
- සුළං සහ අධික වර්ෂාවට ඔරොත්තු දෙන ගොඩනැගිලි ඉදිකිරීම.

- වෙරළබඩ ප්‍රදේශවල ස්වාභාවික ආරක්ෂක පද්ධති හා පරිසර පද්ධති සංරක්ෂණය කිරීම.

අදාළ ආයතන: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC), ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO), පළාත් පාලන ආයතන

2. සූදානම් වීම (Preparedness)

සූදානම් වීම යනු ආපදාව ඇතිවීමට පෙර පුද්ගලයන්, ප්‍රජාව සහ රාජ්‍ය ආයතන ආපදා තත්ත්වයකට සූදානම් කිරීමයි.

දිට්වා වැනි සුළිකුණාටුවකට:

- කාලගුණ දත්ත නිරීක්ෂණය කර පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම.
- අවදානම් ප්‍රදේශවල ජනතාවට කාලෝචිතව අනතුරු ඇඟවීම.
- ඉවත් කිරීමේ මාර්ග සහ ආරක්ෂිත මධ්‍යස්ථාන කලින් හඳුනාගැනීම.
- හදිසි ආහාර, පානීය ජලය, ඖෂධ සහ ප්‍රථමාධාර ද්‍රව්‍ය සූදානම් කිරීම.
- පොලිසිය, ත්‍රිවිධ හමුදාව, සෞඛ්‍ය අංශ සහ DMC අතර සම්බන්ධීකරණය ඇති කිරීම.
- පාසල්, රෝහල් සහ ප්‍රජා මට්ටමින් ආපදා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- විශේෂයෙන් ළමුන්, වැඩිහිටියන් සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා විශේෂ ආරක්ෂණ සැලසුම් සකස් කිරීම.

3. ප්‍රතිචාර දැක්වීම (Response)

ප්‍රතිචාර දැක්වීම යනු ආපදාව සිදුවන අවස්ථාවේදී සහ එයට වහාම පසුව ජීවිත ආරක්ෂා කිරීම සහ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග වේ.

දිට්වා වැනි තත්ත්වයකදී:

- ගංවතුර සහ නායයෑම් අවදානම් ප්‍රදේශවල ජනතාව ආරක්ෂිත ස්ථාන වෙත ඉවත් කිරීම.
- සෙවීම් සහ ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.
- තුවාල ලැබූවන්ට හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම.
- ආරක්ෂිත නවාතැන්, ආහාර සහ පානීය ජලය සැපයීම.
- විදුලි කම්බි, ගස් කඩා වැටීම් සහ ගංවතුර ජලය වැනි ද්විතීයික අවදානම්වලින් ජනතාව ආරක්ෂා කිරීම.
- නිල තොරතුරු පමණක් ජනතාව වෙත ලබාදෙමින් අසත්‍ය තොරතුරු පැතිරීම වැළැක්වීම.
- අදාළ ආයතන: DMC, පොලිසිය, ත්‍රිවිධ හමුදාව, සෞඛ්‍ය අංශ, පළාත් පාලන ආයතන සහ ස්වේච්ඡා සංවිධාන.

4. ප්‍රතිසාධනය හා නැවත ගොඩනැඟීම (Recovery and Reconstruction)

දිට්වා සුළිකුණාටුව වැනි ස්වාභාවිකආපදාවකදී කාන්තාවන් සහ ගැහැණු ළමුන් විශේෂ අවදානම්වලට මුහුණ දිය හැකි බැවින්,කාන්තාවන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම ආපදා කළමනාකරණයේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස සලකා බැලිය යුතුය. මෙහිදී ආරක්ෂිත නවාතැන්, පිරිසිදු ජලය හා සනීපාරක්ෂක පහසුකම්, සෞඛ්‍ය සේවා, ප්‍රජනන සෞඛ්‍ය සේවා සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂ හිංසනයෙන් ආරක්ෂාව ලබාදීම විශේෂයෙන් වැදගත් වේ.

දිට්වා වැනි විශාල පරිමාණයේ ස්වාභාවික ආපදාවකදී ආපදා කළමනාකරණය යනු ආපදාව සිදුවන අවස්ථාවේ පමණක් සිදුකරන ක්‍රියාවලියක් නොවේ. අවදානම් අවම කිරීම, සූදානම් වීම, ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිසාධනය යන අදියර හතර එකිනෙකට සම්බන්ධ වූ අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක කළ යුතුය. විද්‍යාත්මක පූර්ව අනතුරු ඇඟවීම්, නිසි සම්බන්ධීකරණය, කාලෝචිත ඉවත් කිරීම සහ ආපදාවෙන් පසු නිසි ප්‍රතිසාධන සැලසුම් මගින් අනාගත ආපදා හේතුවෙන් සිදුවන ජීවිත හා දේපළ හානි සැලකිය යුතු ලෙස අවම කළ හැකිය.

මෙම දිට්වා ආපදාව ජාතික තලයේ ඇතිවූ එකක් බැවින්, ඒ සම්බන්ධ පැමිණිලිල්ල හා වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම මත පමණක් නොව ඒ සම්බන්ධ විද්‍යාත්මක අධ්‍යන තත්ත්වයන් කෙරෙහි ද අවධානය යොමු කරමින් නිර්දේශ නිකුත් කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදි.

<u>නිර්දේශ</u>

ඉහත කරුණු මත පදනම්ව, ඉදිරියේදී මෙවැනි ආපදා තත්ත්වයන් සඳහා පහත ක්‍රියාමාර්ග ගත යුතු බව නිර්දේශ කෙරේ:

1. කාලගුණ අනතුරු ඇඟවීම් ලබාගැනීම, තහවුරු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලි අන්තර් ආයතනික සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය.

2. දුරකථන හා විදුලිබල පද්ධති අක්‍රිය වූ අවස්ථාවලදීද ක්‍රියාත්මක කළ හැකි විකල්ප සන්නිවේදන පද්ධති පොලිස් ස්ථාන, ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන, ජලාශ සහ ප්‍රාදේශීය පරිපාලන ආයතන සමග සම්බන්ධිකරණය කරන ක්‍රමවේදයක් සකස් කර ගත යුතුයි.

3. අවදානම් ප්‍රදේශවල ආරක්ෂිත ස්ථාන, ඉවත් කිරීමේ මාර්ග සහ ජනතාව දැනුවත් කිරීමේ ක්‍රමවේද කලින් හඳුනාගෙන, ඒ සඳහා අදාළ ප්‍රජාව සමග පුහුණු හා අභ්‍යාස පැවැත්විය යුතුය.

4. ජලාශ ආශ්‍රිතව සයිරන් පද්ධති නිසි පරිදි ස්ථාපිත කර, ඒවායේ ක්‍රියාකාරීත්වය නිරන්තරයෙන් පරීක්ෂා කළ යුතු අතර, සයිරන් නාද කිරීමේ නිශ්චිත නිර්ණායක සහ වගකීම් පැහැදිලිව නියම කළ යුතුය.

5. හදිසි අවස්ථාවලදී ජනතාවට ලබාදෙන පණිවිඩ සරල, පැහැදිලි, නිවැරදි සහ කාලෝචිත විය යුතු අතර, එක් එක් ආයතනය විසින් වෙනස් පණිවිඩ නිකුත් කිරීම වැළැක්වීම සඳහා ඒකාබද්ධ සන්නිවේදන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.

6. ආපදා අවස්ථාවකදී එක් එක් රාජ්‍ය ආයතනයේ වගකීම්, බලතල සහ වගවීම පැහැදිලිව නිර්වචනය කළ යුතු අතර, වගකීම් වෙනත් ආයතන වෙත පැවරීමේ ප්‍රවණතාව වළක්වා ගනිමින් ඒකාබද්ධ සම්බන්ධිකරණ යාන්ත්‍රයන් සකස් කරගත යුතුය.

7. ජනතාව වෙත කෙරෙන සියලු සන්නිවේදන කටයුතු සිංහල, දෙමළ භාෂා වලින් මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී සංඥා භාෂාව යොදා ගැනීම කළ යුතුය.

8. සමස්ත සිද්ධිය සම්බන්ධයෙන් වගකීම් සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය විධිමත් ලෙස සමාලෝචනය කර, හඳුනාගත් අඩුපාඩු නැවත සිදු නොවන පරිදි ආපදා ප්‍රතිචාර අවධානයට ගනිමින් ජාතික මට්ටමේ ක්‍රියාකාරී සැලැස්මක් යාවත්කාලීන කළ යුතුය.

වගඋත්තරකරුවන් විසින් සාමූහිකව සාකච්ඡා කර මෙම නිරදේශ ක්‍රියාත්මක කිරිම සඳහා ගනු ලබන පියවර පිළිබඳව වාර්තාවක් 2026.12.30 වන දිනට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරිමට නියමිත දින සිට සතියක කාලයක් තුල මෙම නිර්දේශ ක්‍රියාත්මකවිම හෝ නොවිම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දිම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. ජනාධිපතිතුමා - කා.දැ.ගැ.ස.
ජනාධිපති ලේකම් කාර්යාලය,කොළඹ.

02. අමාත්‍යතුමා - කා.දැ.ගැ.ස.
ආරක්ෂක අමාත්‍යාංශය,
අංක : 383,බෞද්ධාලෝක මාවත,කොළඹ 07.

03. අමාත්‍යතුමා - කා.දැ.ගැ.ස.
කෘෂිකර්ම, ඉඩම්,පශු සම්පත්,වාරිමාර්ග,
ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය,
අංක : 500 ටි.බි.ජයා මාවත, කොළඹ 10.

04. අමාත්‍යතුමා - කා.දැ.ගැ.ස
සෞඛ්‍ය හා ජන ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක : 163, කිරුලපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ 05.